**විශේෂ වියදම් ඒකක (ශීර්ෂ 1 සිට 22 දක්වා) පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය**

මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.

1 කොටස - විශේෂ වියදම් ඒකක ශීර්ෂයන්ට අදාළ ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව

2 කොටස - එක් එක් විශේෂ වියදම් ඒකක ශීර්ෂයන්ට අදාල විස්තරාත්මක වාර්තාව

## 1 කොටස

### විශේෂ වියදම් ඒකක ශීර්ෂයන්ට අදාල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව

1. **විශේෂ වියදම් ඒකකයට අදාල ශීර්ෂ හා අදාල දෙපාර්තමේන්තු, කාර්යාල හා කොමිෂන් සභා**

| ශීර්ෂය | දෙපාර්තමේන්තුව, කාර්යාලය හා කොමිෂන් සභාවේ නම |
|---|---|
| 1 | අතිගරු ජනාධිපතිතුමා |
| 2 | අග්‍රාමාත්‍ය කාර්යාලය |
| 3 | විශේෂ කාර්යයන් පිළිබඳ ලේකම් කාර්යාලය (ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරු) |
| 4 | උපරිමාධිකරණවල විනිශ්චයකාරවරු |
| 5 | අමාත්‍ය මණ්ඩල කාර්යාලය |
| 6 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| 7 | අධිකරණ සේවා කොමිෂන් සභාව |
| 8 | ජාතික පොලිස් කොමිෂන් සභාව |
| 9 | පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය |
| 10 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව |
| 11 | මුදල් කොමිෂන් සභා කාර්යාලය |
| 12 | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව |
| 13 | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව |
| 14 | නීතිපති දෙපාර්තමේන්තුව |

| | |
|---|---|
| 15 | නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව |
| 16 | පාර්ලිමේන්තුව |
| 17 | පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලය |
| 18 | පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලය |
| 19 | පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ කාර්යාලය |
| 20 | මැතිවරණ දෙපාර්තමේන්තුව |
| 21 | විගණකාධිපති |
| 22 | පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්තුමාගේ කාර්යාලය |

**2.** ගිණුම්

**2.1** විසර්ජන ගිණුම්

මුළු ප්‍රතිපාදනය හා වියදම

දෙපාර්තමේන්තු, කාර්යාල හා කොමිෂන් සභා 22 ක් සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. මිලියන 13,987 ක් වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 11,592 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දෙපාර්තමේන්තු, කාර්යාල හා කොමිෂන් සභාවල ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු.මිලියන 0.11 ක සිට රු.මිලියන 1,722 ත් අතර පරාසයක ප්‍රමාණයකින් හෙවත් මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 0.0007 ත් සියයට 12.31 ත් අතර පරාසයක පැවතුණි. විස්තර පහත දැක්වේ.

| වැය ශීර්ෂය | දෙපාර්තමේන්තුව/ කාර්යාලය/ කොමිෂන් සභාව | ශුද්ධ ප්‍රතිපාදනය | | උපයෝජනය | | ඉතිරිය | |
|---|---|---|---|---|---|---|---|
| | | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන | පුනරාවර්තන | මූලධන |
| | | රු.මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| 1 | අතිගරු ජනාධිපතිතුමා | 4,010.410 | 3,647.755 | 3,888.694 | 2,047.384 | 121.716 | 1,600.371 |
| 2 | අග්‍රාමාත්‍ය කාර්යාලය | 187.725 | 81.400 | 178.226 | 48.713 | 9.499 | 32.687 |
| 3 | විශේෂ කාර්යයන් පිළිබඳ ලේකම් කාර්යාලය (ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරු) | 277.236 | 136.500 | 271.921 | 103.243 | 5.315 | 33.257 |
| 4 | උපරිමාධිකරණවල විනිශ්වයකාරවරු | 182.520 | 34.500 | 170.418 | 23.466 | 12.102 | 11.034 |
| 5 | අමාත්‍ය මණ්ඩල කාර්යාලය | 62.720 | 20.930 | 54.446 | 6.981 | 8.274 | 13.949 |
| 6 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 110.110 | 18.600 | 108.851 | 15.451 | 2.259 | 3.149 |
| 7 | අධිකරණ සේවා කොමිෂන් සභාව | 37.367 | 50.500 | 35.584 | 0.277 | 1.783 | 50.233 |
| 8 | ජාතික පොලිස් කොමිෂන් සභාව | 38.297 | 4.252 | 36.042 | 0.216 | 2.255 | 4.036 |
| 9 | පරිපාලන අභියාචනා විනිශ්වය අධිකාරිය | 12.5555 | 0.150 | 11.705 | 0.052 | 0.850 | 0.098 |
| 10 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | 136.993 | 99.000 | 131.842 | 69.389 | 4.151 | 29.611 |
| 11 | මුදල් කොමිෂන් සභා කාර්යාලය | 37.557 | 32.400 | 34.740 | 0.808 | 2.817 | 31.592 |
| 12 | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව | 25.196 | 0.385 | 20.958 | 0.279 | 4.238 | 0.106 |
| 13 | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව | 144.075 | 2.950 | 137.746 | 2.184 | 6.329 | 0.766 |
| 14 | නීතිපති දෙපාර්තමේන්තුව | 444.425 | 20.400 | 428.620 | 15.257 | 15.805 | 5.143 |
| 15 | නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව | 51.477 | 82.600 | 48.533 | 7.570 | 2.944 | 75.030 |
| 16 | පාර්ලිමේන්තුව | 1,621.850 | 177.040 | 1,570.244 | 115.158 | 51.606 | 61.882 |
| 17 | පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලය | 24.300 | 1.200 | 22.581 | 0.920 | 1.719 | 0.280 |
| 18 | පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලය | 34.430 | 7.421 | 33.491 | 7.020 | 0.938 | 0.401 |
| 19 | පාර්ලිමේන්තුවේ විපක්ෂ | 57.415 | 10.700 | 52.802 | 9.391 | 4.613 | 1.309 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | නායකතුමාගේ කාර්යාලය | | | | | | |
| 20 | මැතිවරණ දෙපාර්තමේන්තුව | 939.841 | 26.600 | 930.113 | 23.773 | 9.728 | 2.827 |
| 21 | විගණකාධිපති | 710.092 | 378.147 | 694.444 | 223.975 | 15.648 | 154.172 |
| 22 | පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්තුමාගේ කාර්යාලය | 8.037 | 0.100 | 7.948 | 0.081 | 0.089 | 0.019 |
| | **එකතුව** | **9,153.628** | **4,833.530** | **8,870.949** | **2,721.588** | **284.679** | **2,111.942** |

## 2.2 ආදායම් ගිණුම්

### ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම

දෙපාර්තමේන්තු, කාර්යාල හා කොමිෂන් සභා 22 ක් අතරින් දෙපාර්තමේන්තු 02 ක් විසින් 2012 වර්ෂය සඳහා ආදායම් සංකේත දෙකක් යටතේ රු.මිලියන 77 ක ආදායමක් ඇස්තමේන්තු කර තිබුණු අතර ඇස්තමේන්තුගත ආදායම රු.මිලියන 17.56 කින් ඉක්මවා රු.මිලියන 94.56 ක් රැස් කර තිබුණි. ඒ අනුව ඇස්තමේන්තුගත ආදායම සියයට 22.80 කින් ඉක්මවා ආදායම රැස්කිරිමට සමත්වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් ගණන් දීමේ නිලධාරී | ආදායම් සංකේතය | ඇස්තමේන්තුගත | තථ්‍ය | වැඩියෙන් එකතු කිරිම |
|---|---|---|---|---|
| | | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| විගණකාධිපති | 2003-02-01 | 45.000 | 60.203 | 15.203 |
| නීතිපති | 2003-02-11 | 32.000 | 34.360 | 2.360 |
| | | 77.00 | 94.563 | 17.563 |

## 2.3 අත්තිකාරම් ගිණුම්

### 2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්

දෙපාර්තමේන්තු, කාර්යාල හා කොමිෂන් සභා 22 වෙත රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් ආයතන 21 ක් විසින් පිළිපැද තිබුණු අතර, එක් ආයතනයක් විසින් උපරිම හර ශේෂ සීමාව රු.291,863 කින් ඉක්මවා තිබුණි. විස්තර පහත දැක්වේ.

| වැය ශීර්ෂය | විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | | හර ශේෂ සීමාවන් ඉක්මවීම |
|---|---|---|---|---|---|---|---|---|
| | | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය | |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 1 | 00101 | 20,000,000 | 13,517,434 | 12,000,000 | 18,310,834 | 90,000,000 | 73,231,781 | - |
| 2 | 00201 | 7,000,000 | 3,248,042 | 3,200,000 | 4,031,506 | 23,600,000 | 20,638,820 | - |
| 3 | 00301 | 2,500,000 | 2,466,112 | 600,000 | 1,414,882 | 8,000,000 | 5,773,580 | - |
| 4 | 00401 | 12,200,000 | 10,805,037 | 5,400,000 | 9,919,963 | 52,000,000 | 32,495,336 | - |
| 5 | 00501 | 2,600,000 | 2,595,796 | 2,000,000 | 2,736,077 | 11,000,000 | 11,291,863 | 291,863 |
| 6 | 00601 | 8,000,000 | 3,016,904 | 2,000,000 | 5,125,517 | 32,000,000 | 21,883,293 | - |
| 7 | 00701 | 3,000,000 | 1,414,095 | 1,200,000 | 1,950,269 | 17,500,000 | 8,259,352 | - |
| 8 | 00801 | 1,950,000 | 1,288,317 | 1,500,000 | 1,742,018 | 11,000,000 | 4,216,917 | - |
| 9 | 00901 | 1,000,000 | 388,487 | 260,000 | 345,570 | 4,000,000 | 1,219,236 | - |
| 10 | 01001 | 6,000,000 | 2,608,065 | 2,500,000 | 4,000,143 | 25,000,000 | 17,789,687 | - |
| 11 | 01101 | 4,000,000 | 2,020,679 | 4,000,000 | 1,348,384 | 20,000,000 | 7,509,386 | - |
| 12 | 01201 | 1,500,000 | 663,247 | 600,000 | 1,305,319 | 6,000,000 | 2,747,287 | - |
| 14 | 01401 | 23,500,000 | 16,890,877 | 10,000,000 | 13,619,423 | 90,000,000 | 46,511,882 | - |
| 15 | 01501 | 5,300,000 | 2,644,811 | 2,000,000 | 3,532,865 | 24,000,000 | 14,163,257 | - |
| 16 | 01601 | 39,500,000 | 26,907,810 | 20,000,000 | 27,932,046 | 175,000,000 | 144,082,287 | - |
| 17 | 01701 | 1,200,000 | 1,196,000 | 800,000 | 1,330,225 | 3,500,000 | 2,185,355 | - |
| 18 | 01801 | 2,000,000 | 1,282,200 | 1,000,000 | 1,520,120 | 7,500,000 | 4,379,559 | - |
| 19 | 01901 | 1,500,000 | 1,261,790 | 1,000,000 | 1,961,169 | 9,000,000 | 3,879,441 | - |
| 20 | 02001 | 23,000,000 | 14,068,857 | 14,000,000 | 15,200,062 | 80,000,000 | 58,182,585 | - |
| 21 | 02101 | 58,000,000 | 52,191,250 | 40,000,000 | 51,829,346 | 300,000,000 | 265,787,391 | - |
| 22 | 02201 | 800,000 | 713,300 | 180,000 | 303,018 | 30,000,000 | 1,770,638 | - |

## 2.3.2 පොදු තැන්පත් ගිණුම්

2012 දෙසැම්බර් 31 දිනට දෙපාර්තමේන්තු, කාර්යාල හා කොමිෂන් සභා 22 ක් අතුරින් ආයතන 16 ක පොදු තැන්පත් ගිණුම්වල ශේෂවල එකතුව රු.637,708,965 ක් වූ අතර ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| වැය ශීර්ෂය | දෙපාර්තමේන්තුව/ කාර්යාලය/ කොමිෂන් සභාව | ගිණුම් අංකය | 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය හර/(බැර) |
|---|---|---|---|
| | | | රු. |
| 1 | අතිගරු ජනාධිපතිතුමා | 6000/0006/0077 | (402,834,548) |
| 2 | අග්‍රාමාත්‍ය කාර්යාලය | 6000/0015/0001 | (153,999,085) |
| | | 6000/0015/0002 | (1,784,268) |
| 3 | විශේෂ කාර්යයන් පිළිබඳ ලේකම් කාර්යාලය (ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරු) | 6000/0015/0003 | (3,590,824) |
| 5 | අමාත්‍ය මණ්ඩල කාර්යාලය | 6000/0015/0003 | (1,302,518) |
| 6 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 6000/0015/0008 | (1,461,239) |
| 7 | අධිකරණ සේවා කොමිෂන් සභාව | 6000/0002/0032 | (124,149) |
| 8 | ජාතික පොලිස් කොමිෂන් සභාව | 6000/0015/0009 | (849,893) |
| 10 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | 6000/0015/0010 | (4,421,340) |
| 11 | මුදල් කොමිෂන් සභා කාර්යාලය | 6000/0015/0013 | (530,175) |
| 12 | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව | 6000/0015/0014 | (68,975) |
| 13 | ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව | 6000/0015/0170 | 12,367,420 |
| 14 | නීතිපති දෙපාර්තමේන්තුව | 6000/0015/0110 | (7,377,767) |
| 15 | නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුව | 6000/0015/0111 | (2,758,815) |
| 16 | පාර්ලිමේන්තුව | 6000/0015/0004 | (14,642,211) |
| 20 | මැතිවරණ දෙපාර්තමේන්තුව | 6000/0015/0011 | (11,320,216) |
| 21 | විගණකාධිපති | 6000/0015/0012 | (43,010,362) |
| | **එකතුව** | | 637,708,965 |

## 2.3.3 අග්‍රිම ගිණුම්

දෙපාර්තමේන්තු, කාර්යාල හා කොමිෂන් සභා 22 ක් අතුරින් ආයතන 20 ක 2012 දෙසැම්බර් 31 දින වන විට අග්‍රිම ගිණුම්වල ශේෂය රු.19,462,075 ක් වූ අතර, විස්තර පහත සඳහන් වේ.

| වැය ශීර්ෂය | දෙපාර්තමේන්තුව/ කාර්යාලය/ කොමිෂන් සභාව | ගිණුම් අංකය | 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය හර/(බැර) |
|---|---|---|---|
| | | | රු. |
| 1 | අතිගරු ජනාධිපතිතුමා | 7002/0000/0117/0011 | 315,217 |
| | | 7003/0000/0077/0012 | (38,558) |
| 2 | අග්‍රාමාත්‍ය කාර්යාලය | 7002/0000/0118/0012 | 529 |
| 4 | උපරිමාධිකරණවල විනිශ්වයකාරවරු | 7002/0000/0390/0012 | 730,934 |
| 5 | අමාත්‍ය මණ්ඩල කාර්යාලය | 7002/0000/0119/0012 | 2,121,931 |
| 6 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව | 7002/0000/00/0297/0012 | 277,882 |
| 7 | අධිකරණ සේවා කොමිෂන් සභාව | 7002/0000/00/0122/0012 | 12,106,760 |
| 8 | ජාතික පොලිස් කොමිෂන් සභාව | 7002/0000/00/0365/0012 | 17,431 |
| 9 | පරිපාලන අභියාචනා විනිශ්වය අධිකාරය | 7002/0000/00/036/0012 | 180,782 |
| 10 | අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව | 7002/000/00/0139/0012 | 694,733 |
| 11 | මුදල් කොමිෂන් සභා කාර්යාලය | 7002/000/00/0729/0012 | 8,580 |
| 12 | ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව | 7002/000/00/0408/0012 | 495,528 |
| 14 | නිතිපති දෙපාර්තමේන්තුව | 7002/0000/00/0137/0012 | 52 |
| 15 | නීති කෙටුම්පත් සම්පාදන දෙපාර්තමේන්තුව | 7002/0000/00/0138/0012 | 288,929 |
| 16 | පාර්ලිමේන්තුව | 7002/0000/00/0120/0012 | 600 |
| 17 | පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලය | 7002/0000/00/0275/0012 | 226,720 |
| 18 | පාර්ලිමේන්තුවේ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමාගේ කාර්යාලය | 7002/0000/00/0276/0012 | 268,007 |
| 19 | පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ කාරියාලය | 7002/0000/00/0277/0012 | 5,470 |
| 20 | මැතිවරණ දෙපාර්තමේන්තුව | 7002/0000/000/0121/0012 | 61,247 |
| 21 | විගණකාධිපති | 7002/0000/00/0001/0012 | 14,768 |
| | | 7003/0000/00/0089/0012 | 1,554,136 |
| 22 | පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්තුමාගේ කාර්යාලය | 7002/000/00/0209/0012 | 130,397 |
| | එකතුව | | 19,462,075 |

## 2 කොටස

--------------

### එක් එක් වැය ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව

----------------------------------------------------------

**1. ශීර්ෂය 1 - අතිගරු ජනාධිපතිතුමා**

---------------------------------

**1.1 විගණන විෂය පථය**

--------------------

ජනාධිපති ලේකම් කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ජනවාරි 21 දින ජනාධිපති ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය පිළිබඳ විගණන නිරීක්ෂණ අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශනය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන නිරීක්ෂණය**

---------------------

2012 දෙසැම්බර් 31 දිනට මුල්‍ය වාර්තා හා පොත් අනුව ජනාධිපති ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වු පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.6 දක්වා ජේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

-------------------

වැය විෂයයන් 03 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය රු.993,236,379 ක් වූ අතර, එය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 95 සිට සියයට 98 ක් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ආ) පොදු තැන්පත් ගිණුම**

-----------------------

වර්ෂ 2 ට වැඩි කාලයක සිට පැවත එන රු.37,480,220 ක තැන්පත් ගිණුමේ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**(ඇ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිලිබඳ සැසඳුම් ප්‍රකාශය**

--------------------------------------------------------------

විෂයය අංක 00101 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.958,928 ක් වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමට කාර්යාලය අපොහොසත් වී තිබුණි.

**1.4 අනුකූල නොවීම්**

--------------------

**නිති, රීති, රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

-----------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වු නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවු අවස්ථාවක් විග්‍රහ කර පහත දැක්වේ.

මුදල් රෙගුලාසි 94 ප්‍රකාර ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට එළඹීම සිදු නොකළ යුතු වුවත් සමාලෝචිත වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයන් 03 කට හා මූලධන වැය විෂයයන් 05 කට

අදාලව ඉතිරියේ එකතුව රු.356,994,014 ක් ඉක්මවා රු.401,402,702 කින් බැරකම්වලට බැදී තිබුණි.

## 1.5 පාඩු හා හානි

---------------

නියැදි විගණන පරීක්ෂාවලදී අනාවරණය වු පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) වාහන 12 කට සිදුවූ රිය අනතුරු සඳහා රක්ෂණ වන්දි ලැබීමෙන් පසු තවදුරටත් අයකර ගතයුතු හෝ කපාහල යුතු බවට හානි හා පාඩු ලේඛනයේ සටහන් කර තිබූ රු.3,715,594 ක් විසර්ජන ගිණුමේ ඇතුළත් කර නොතිබුණි.

(ආ) 2012 වර්ෂය තුලදී වාහන 24 කට සිදු වු රිය අනතුරු සඳහා රක්ෂණ වන්දි ලැබීම් විසර්ජන ගිණුමේ සඳහන් කර නොතිබුණි.

## 1.6 මානව සම්පත් කළමනාකරණය

--------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

---------------------------------------------------

2012 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | | 2012 දෙසැම්බර් 31 දිනට තථ්‍ය සේවක සංඛ්‍යාව | | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|
| | ස්ථිර | තාවකාලික | ස්ථිර | තාවකාලික | | |
| (අ) ජොෂ්ඨ මට්ටම | 56 | 162 | 45 | 226 | 11 | 64 |
| (ආ) තෘතීයික මට්ටම | 23 | 95 | 16 | 128 | 07 | 33 |
| (ඇ) ද්විතියික මට්ටම | 326 | 80 | 258 | 104 | 68 | 24 |
| (ඈ) ප්‍රාථමික මට්ටම | 603 | 142 | 475 | 168 | 128 | 26 |
| එකතුව | 1008 | 479 | 794 | 626 | 214 | 147 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට ස්ථිර තනතුරුවල 214 ක් පුරප්පාඩු පැවති අතර තාවකාලික තනතුරුවල අතිරික්ත සේවක සංඛ්‍යාව 147 ක් සඳහා විධිමත් අනුමැතියක් ලබා ගෙන නොතිබුණි.

## 2. ශීර්ෂය 2 - අග්‍රාමාත්‍ය කාර්යාලය

-----------------------------------

### 2.1 විගණන විෂය පථය

---------------------

අග්‍රාමාත්‍ය කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 නොවැම්බර් 28 දින අග්‍රාමාත්‍ය ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය පිළිබඳ විගණන නිරීක්ෂණ අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

--------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනය සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 2.3 විගණන නිරීක්ෂණය

-----------------------

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව අග්‍රාමාත්‍ය කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන යාවත්කාලීන නොකිරීම**

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන නොතිබුණි.

**(ආ) අයවැය විචලනය**

(i) මුලධන වැය විෂයයන් 2 ක් සඳහා සළසා තිබුණු රු.5,550,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) පුනරාවර්තන වැය විෂයයන් 15 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය රු.8,773,003 ක් වූ අතර එය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 6 ත් සියයට 99 ත් අතර පරාසයක පැවතුණි.

**(ඇ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

2011 අප්‍රේල් 06 දින සේවය අතහැර ගිය නිලධාරියෙකුගේ රු.38,836 ක ණය ශේෂය හා 2011 අගෝස්තු 17 දින සේවය අවසන් කර ඇති නිලධාරියෙකුගේ රු.3,500 ක උත්සව අත්තිකාරම් ශේෂය 2012 දෙසැම්බර් 31 දින වන විටත් අය කර ගෙන නොතිබුණි.

## 2.4 අනුකූල නොවීම්

**නිති, රීති, හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව ලබා ගත් අත්තිකාරම එම කාර්ය නිමවූ වහාම පියවිය යුතු වුවත්, ලබා ගෙන තිබුණු රු.272,582 ක අත්තිකාරම් 2013 දෙසැම්බර් 31 දින වන තෙක් පියවා නොතිබුණි. එසේම අත්තිකාරම් ලබා ගැනීමේදී විධිමත් පරිදි ඇස්තමේන්තු පිළියෙල කර නොතිබුණි.

## 2.5 පාඩු හා හානි

-------------

මෝටර් රථ සඳහා තෙවන පාර්ශවයේ රක්ෂණ ආවරණ ලබා ගැනිම හා වෙළඳ පොල වටිනාකමට වඩා අඩු වටිනාකමට රක්ෂණය කිරිම හේතුවෙන් මෝටර් රථ 04 ක් අනතුරුවලට ලක් විමෙන් සිදු වු එකතුව රු.1,242,417 ක් වු අලාභයන් ගෙන් රක්ෂණ වන්දි ලැබී තිබුණේ රු.257,770 ක් පමණි. ඒ අනුව රු.984,647 ක හානියක් අලාභයක් ලෙස කපා හැරීමට සිදු වී තිබුණි.

## 2.6 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

---------------------------------------------------------

2012 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 14 | 11 | 03 |
| (ආ) | තෘතියික මට්ටම | 05 | 04 | 01 |
| (ඇ) | ද්විතීක මට්ටම | 44 | 43 | 01 |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | 67 | 62 | 05 |
| | එකතුව | 130 | 120 | 10 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 10 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

**3. ශීර්ෂය 3 - විශේෂ කාර්යයන් පිළිබඳ ලේකම් කාර්යාලය (ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරු)**

**3.1 විගණන විෂය පථය**

විශේෂ කාර්යයන් පිළිබඳ ලේකම් කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 මැයි 29 දින ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**3.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

**3.3 විගණන නිරීක්ෂණය**

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව විශේෂ කාර්යයන් පිළිබඳ ලේකම් කාර්යාලයේ විසර්ජන ගිණුම, හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සහ (ආ) හි වූ පොදු නිරීක්ෂණ සහ පහත 3.4 සිට 3.8 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

---

කාර්යාලය විසින් මුදල් රෙගුලාසි 214 ප්‍රකාර බැරකම් ලේඛනයක් පවත්වා නොතිබුණු බවත් ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණ වලදී නිරීක්ෂණය විය.

**(ආ) අයවැය විචලනය**

---

(i) පුනරාවර්තන වැය විෂයයන් 06 ක් සඳහා සලසා තිබුණු රු.300,000 ක හා මූලධන වැය විෂයයන් 21 ක් සඳහා සලසා තිබුණු රු.7,850,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 38 කට රු.38,578,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර එයින් රු.16,638,041ක් උපයෝජනය කිරීමෙන් පසු රු.21,939,959 ක ඉතිරියක් නිරීක්ෂණය විය. එම ඉතිරියන් අදාල වැය විෂයයන් යටතේ සලසා තිබූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 20 සිට සියයට 99 දක්වා වූ පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

**3.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

---

**3.4.1 සංයුක්ත සැලැස්ම**

---

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලස්මක් කාර්යාලය විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කල යුතු වුවත්, එම සැලස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**3.4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

ඉහත 3.4.1 ඡේදයෙහි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව පිළියෙල කරන ලද සංයුක්ත සැලස්මට අනුකූලව 2010 සහ ඉන් ඉදිරියට කාර්යාලය වාර්ෂික ක්‍රියාකාරී සැලස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**3.4.3 වාර්ෂික කාර්යසාධන වාර්තා**

ඉහත 3.4.1 ඡේදයෙහි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දින හා අංක 402 සහ 2004 පෙබරවාරි 20 දින හා අංක 402(1) දරන දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර කාර්යාලය විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව 2013 අගෝස්තු 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**3.4.4 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් විධිමත්ව පිළියෙල කර නොතිබුණි.

**3.4.5 අභ්‍යන්තර විගණනය**

2009 ජුනි 09 දිනැති අංක ඩීඑම්ඒ/2009(1) දරන කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාර අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2012 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර එම වාර්තා 2013 මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත්, කාර්යාලය විසින් එම

වාර්තා 2013 මැයි 31 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර තිබුණේ 2011 වර්ෂය වෙනුවෙනි.

**(ආ) බේරුම් නොකළ බැරකම්**

**-------------------------**

ලේකම් කාර්යාලය විසින් 2012 දෙසැම්බර් 31 දිනට වර්ෂයට අඩු බේරුම් නොකළ බැරකම් වටිනාකම රු.16,368,664 ක් වූ අතර රු.401,197 ක් වූ බැරකම් ගිණුමේ දක්වා නොතිබුණි.

## 3.6 අනුකූල නොවීම්

**------------------**

**(අ) නීති,රීති,රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

**------------------------------------------------**

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| (අ) මුදල් රෙගුලාසි | | |
| (i) මුදල් රෙගුලාසි 66(3)(ඇ) | 1,450,000 | ප්‍රතිපාදන මාරුකිරීමේ ඉල්ලුම්පත් 2012 දෙසැම්බර් 31 දිනට පෙර ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 94(1) | 13,635,278 | දරන ලද බැරකම් සහ වැය ප්‍රමාණය කිසිම විටක මුදල් වර්ෂය සඳහා ප්‍රතිපාදන නොඉක්මවිය යුතු වුවත් ප්‍රතිපාදන නොමැතිව බැරකම්වලට බැඳී තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි751 (1) | | නිල නිවාස සඳහා බඩු ලේඛණ හා තොග පොත් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 754 | | ලේකම් කාර්යාලයේ වර්ෂය අවසානයේ තොග පොත් තුලනය කර |

| | |
|---|---|
| | නොතිබුණි. |
| (v) මුදල් රෙගුලාසි 756(2)(අ) | ගබඩා භාර නිලධාරියා භාණ්ඩ සමීක්ෂණ මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කර තිබුණි. |
| (vi) මුදල් රෙගුලාසි 757(4) | වාහන සම්බන්ධයෙන් පැවැත්ම පිළිබඳව භෞතිකව පරික්ෂාකර සමීක්ෂණ මණ්ඩල වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |
| (vii) මුදල් රෙගුලාසි 1646 | දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

**(ආ) භාණ්ඩාගාර චක්‍රලේඛ**

| | |
|---|---|
| 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛයේ 2 ඡේදය | ස්ථාවර වත්කම් ලේඛණයේ 2011 හා 2012 වර්ෂයේදී මිලදී ගත් වාහන පමණක් ඇතුලත් කර තිබුණු අතර වෙනත් ආයතනවලින් නිසි පරිදි පවරාගත් වාහන 04 ක් ඇතුලත් කර නොතිබුණි. |

**(ඇ) ජාතික අයවැය චක්‍රලේඛ**

| | |
|---|---|
| 2010 ජුනි 01 දිනැති අංක BD/356/413/3/2008 දරන ජාතික අයවැය අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය | ව්‍යාපෘති ආධාරවලින් සපයන ලද වාහන එම ව්‍යාපෘතිය සඳහාම යොදවා ගත යුතු වුවත්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ සන්නිවේදන හා ප්‍රතිචාර දැක්වීමේ ධාරිතා සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ලබා දුන් වාහනයක් විශේෂ කාර්යයන් පිළිබඳ ලේකම් කාර්යාලය වෙත රැගෙන විත් තිබුණි. |

## 3.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

සනීපාරක්ෂක සේවා සැපයීම සඳහා හා ආරක්ෂක සේවා සැපයීම සඳහා ලංසු කැඳවීමේදී, ලංසු ඇගයීම සඳහා භාවිත කළ ප්‍රධාන නිර්නායකයන් පිළිබඳ තොරතුරු ලංසු අයදුම් පත්‍රයට ඇතුලත්

කර නොතිබුණි. එසේවුවත් එක් අයදුම්පත්‍රයක එම නිර්නායකයන් අත්අකුරින් ලියා එම ලංසුකරු සේවාවන් සැපයීම සඳහා තෝරාගෙන තිබුණි.

## 3.8. මානව සම්පත් කළමනාකරණය

-------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

---------------------------------------------------

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 19 | 04 | 15 |
| (ආ) | තෘතියික මට්ටම | 01 | 01 | - |
| (ඇ) | ද්විතීක මට්ටම | 23 | 22 | 01 |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | 102 | 102 | - |
| (ඉ) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 140 | 140 | - |
| | එකතුව | 285 | 269 | 16 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 16 ක් පිරවීමට ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි.

## 4. ශීර්ෂය 4 - උපරිමාධිකරණ විනිශ්චයකාරවරු

-----------------------------------------------

### 4.1 විගණන විෂය පථය

----------------------

උපරිමාධිකරණ විනිශ්චයකාරවරු කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ඔක්තෝබර් 31 දින කාර්යාලයේ රෙජිස්ට්‍රාර් වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙළ කරන ලද්දකි.

### 4.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ වගකීම

-----------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකිමට ඇතුළත් වේ.

### 4.3 විගණන නිරීක්ෂණ

---------------------

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව උපරිමාධිකරණ විනිශ්චයකාරවරු දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සහ (ආ) හි වූ පොදු නිරීක්ෂණය සහ පහත 4.4 සිට 4.6 දක්වා ජේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

**-----------------**

(i) වැය විෂයයන් 04 ක් සඳහා සලසා තිබුණු රු.2,580,000 ක මුලු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 14 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය රු. 10,287,604 ක් වූ අතර එය එම වැය විෂයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 සිට සියයට 81 ක් දක්වා පරාසයක් ගෙන තිබුණි.

**(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**-------------------------------------------------------------------**

විෂය අංක 04011 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂ වල එකතුව රු.291,826 ක් වූ අතර, එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමට කාර්යාලය අපොහොසත් වී තිබුණි.

## 4.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

----------------------------------------

### 4.4.1 වාර්ෂික කාර්යසාධන වාර්තා

**-----------------------------**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5/(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර කාර්යාලය විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර තිබුණේ 2013 ජූනි 19 දින දීය.

### 4.4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

**--------------------------------**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව 2012 වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**4.5 කාර්ය සාධනය**

**-----------------**

උපරිමාධිකරණ විනිශ්චයකාරවරු කාර්යාලය විසින් 2012 ජනවාරි 01 දින වන විට විසඳීමට ඇති නඩු සංඛ්‍යාව 2937 ක් වූ අතර, 2012 වර්ෂයේදී අලුතින් ලියාපදිංචි වූ නඩු සංඛ්‍යාව 2018 ක් වූයෙන්, 2012 වර්ෂයේදී විසඳීමට ඇති මුළු නඩු සංඛ්‍යාව 4955 ක් විය. මෙම නඩු සංඛ්‍යාවෙන් වර්ෂය තුළ නඩු 1562 ක් අවසන් කර තිබූ අතර, 2012 දෙසැම්බර් 31 දින වන විට විසඳීමට ඇති නඩු සංඛ්‍යාව 3393 ක් විය.

**4.6 මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව සහ තථ්‍ය සේවක සංඛ්‍යාව**

**------------------------------------------------------**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

| | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සේවක සංඛ්‍යාව** | **අතිරික්ත සංඛ්‍යාව** |
|---|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 07 | 06 | 01 | - |
| (ආ) | තෘතියික මට්ටම | 03 | 07 | - | 04 |
| (ඇ) | ද්විතියික මට්ටම | 119 | 131 | - | 12 |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | 91 | 123 | - | 32 |
| (ඉ) | වෙනත් (අනියම්, තාවකාලික පදනම) | - | 02 | - | 02 |
| | එකතුව | 220 | 269 | 01 | 50 |

බඳවා ගෙන තිබුණු අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳ විධිමත් අනුමැතියක් ලබා ගැනීමට කාර්යාලය කටයුතු කර නොතිබුණි.

## 5. ශීර්ෂය 05 - අමාත්‍ය මණ්ඩල කාර්යාලය

-------------------------------------------

### 5.1 විගණන විෂය පථය

--------------------

අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ජුනි 06 දින කාර්යාලයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 5.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

--------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකිම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරිම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

### 5.3 විගණන නිරීක්ෂණය

-------------------

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) හි සඳහන් පොදු නිරීක්ෂණය සහ පහත 5.4 සිට 5.8 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) **අයවැය විචලනය**

**-------------------**

(i) වැය විෂයයන් 01 ක් සඳහා සලසා තිබුණු රු.9,000,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 04 කට රු.17,070,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර එයින් රු.4,911,701 ක් උපයෝජනය කිරීමෙන් පසු රු.12,158,299 ක ඉතිරියක් නිරීක්ෂණය විය. එම ඉතිරියන් අදාල වැය විෂයයන් සලසා තිබූ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් සියයට 41 සිට සියයට 94 දක්වා වූ පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

## 5.4 යහපාලනය හා ගිණුම්කටයුතුභාවය

**-------------------------------------**

### 5.4.1 වාර්ෂික කාර්යසාධන වාර්තා

**------------------------------**

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 401 සහ 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර කාර්යාලය විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්**,** සමාලෝචිත වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව 2013 අගෝස්තු 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 5.4.2 අභ්‍යන්තර විගණනය

**----------------------**

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

### 5.4.3 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම

**-----------------------------------------------------**

විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර නොතිබුණි.

**5.5 වත්කම් කළමනාකරණය**

(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2012 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර එම වාර්තා 2013 මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, කාර්යාලය විසින් එම වාර්තා 2013 අප්‍රේල් 02 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් භාණ්ඩ සමීක්ෂණය සිදුකර තිබුණේ 2011 වර්ෂය වෙනුවෙනි.

**5.6 අනුකූල නොවීම්**

**නීති,රීති,රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) මුදල් රෙගුලාසි** | | |
| (i) මුදල් රෙගුලාසි 231 (1) හා (2) | 25,725 | ගෙවීම් තහවුරු කිරීමට ලිඛිත සාක්ෂි ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 257 | 36,701 | වවුචර සහතික කිරීමකින් තොරව මුදල් ගෙවා තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 264 (1) | 253,292 | වවුචරයේ සඳහන් දළ මුදල ලද බවට ආදායකයාගෙන් ලදුපතක් ලබා ගෙන නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 1646 | | මෝටර් වාහනවල දෛනික ධාවන සටහන් විගණනයට ඉදිරිපත් කර |

| | | | |
|---|---|---|---|
| | | | නොතිබුණි. |
| **(ආ)** | **භාණ්ඩාගාර චක්‍රලේඛ**<br>**------------------------**<br>2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන චක්‍රලේඛය | | පරිගණක හා පරිගණක උපාංග සහ මෘදුකාංග සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඇ) | **ජාතික අයවැය චක්‍රලේඛ**<br>**------------------------**<br>2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරණ චක්‍රලේඛයේ 1.1.3 - 1.1.7 දක්වා ඡේද | 1,300,936 | ස්ථාන මාරු ලැබ පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂ අදාල කාලය තුලදී මාසික ගිණුම් සාරාංශ මගින් පියවීමට කටයුතු කර නොතිබුණි. |
| **(ඇ)** | **2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධි විධාන) පනත** | 216,765 | රු.25000 කට වැඩි ගෙවීම් සඳහා රු.25 ක මුද්දර ගාස්තු අය කර නොතිබුණි. |

## 5.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

**------------------------------**

කාර්යාලය විසින් කර ඇති සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණ වලදී එසේ අනාවරණය වූ ගනුදෙනුවක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

201 දෙසැම්බර් 07 දිනැති අංක 150 දරන චක්‍රලේඛයේ 6 ඡේදය ප්‍රකාරව කල් බදු ලීසිං ක්‍රමය යටතේ ලබාගත හැකි වාහන වල අමාත්‍යාංශ ලේකම් හා සමාන තනතුරකට හිමි උපරිම මිල මට්ටම් සීමාව රු.5,000,000 ක් වුවද එම සීමාව ඉක්මවා රු.6,750,000 කට (KR - 7399) වාහනයක් ලබාගෙන එය කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ නීති උපදේශක වරයාට ලබා දී තිබුණි.

## 5.8 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2012 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 13 | 10 | 03 | - |
| (ආ) | තෘතියික මට්ටම | 07 | 06 | 01 | - |
| (ඇ) | ද්විතියික මට්ටම | 29 | 21 | 08 | - |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | 28 | 24 | 04 | - |
| (ඉ) | වෙනත් (අනියම්, තාවකාලික පදනම) | - | 03 | - | 03 |
| | එකතුව | 77 | 64 | 16 | 03 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පුරප්පාඩු 16 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

## 6. ශීර්ෂය 06 - රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය

### 6.1 විගණන විෂය පථය

රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ජනවාරි 09 දින කොමිෂන් සභාවේ ලේකම්වරිය වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් පදනම්වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය,

අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 6.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 6.3 විගණන නිරීක්ෂණය

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සහ (ආ) හි වූ පොදු නිරීක්ෂණ සහ පහත 6.4 සහ 6.5 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) අයවැය විචලනය

වැය විෂයයන් 03 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය රු.2,452,617 ක් වූ අතර, එය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 35.6 ත් සියයට 69.4 ත් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

### (ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

විෂය අංක 00601 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව, 2001 ජුලි 01 දින සේවය අතහැර ගිය නිලධාරියෙකුගේ රු.32,320 ක් වූ ණය ශේෂය සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අයකර ගැනිමට නොහැකි වි තිබුණි.

## 6.4 යහ පාලනය හා ගිණුම්කටයුතුභාවය

### 6.4.1 සංයුක්ත සැලැස්ම

2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව, 2013 දෙසැම්බර් 31 දින වන විටත් කොමිෂන් සභාවේ කාර්යාලයට අදාල සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

### 6.4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

ඉහත 6.4.1 ඡේදයේ සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

## 6.5 මානව සම්පත් කළමනාකරණය

### අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 44 | 34 | 10 |
| (ආ) | තෘතියික මට්ටම | 05 | 04 | 01 |
| (ඇ) | ද්විතියික මට්ටම | 98 | 83 | 15 |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | 48 | 33 | 15 |
| | එකතුව | 195 | 154 | 41 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 41 ක් පිරවීමට කාර්යාලය අපොහොසත් වී තිබුණි.

## 7. ශීර්ෂය - 07 අධිකරණ සේවා කොමිෂන් සභාව

### 7.1 විගණන විෂය පථය

අධිකරණ සේවා කොමිෂන් සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 දෙසැම්බර් 06 දින කොමිෂන් සභාවේ ලේකම් වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙළ කරන ලද්දකි.

### 7.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 7.3 විගණන නිරීක්ෂණය

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව අධිකරණ සේවා කොමිෂන් සභාවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) ඉහි සඳහන් පොදු නිරීක්ෂණය සහ 7.4 සහ 7.5 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

---------------------

(i) වැය විෂයයන් 03 ක් සඳහා සළසා තිබුණු රු.50,150,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) එක් වැය විෂයක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය රු.10,287,604 ක් වූ අතර එය එම වැය විෂයයට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 27 කි.

**7.4. යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

-------------------------------------

**7.4.1 සංයුක්ත සැලැස්ම**

--------------------

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5/(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් කොමිෂන් සභාව විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 වන විටත් පිළියෙල කර නොතිබුණි.

**7.4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

-----------------------------

ඉහත 7.4.1 ඡේදයේ සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මට අනුකූලව 2010 සහ ඉන් ඉදිරියට කොමිෂන් සභාව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර තිබුණේ 2012 දෙසැම්බර් 26 දින දීය.

**7.4.3 වාර්ෂික කාර්යසාධන වාර්තා**

-----------------------------

ඉහත 7.4.1 ඡේදයේ සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර කොමිෂන් සභාව විසින් පිළියෙල කල යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ

සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව 2013 අගෝස්තු 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 7.4.4 අභ්‍යන්තර විගණනය

------------------------

කොමිෂන් සභාව අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.

### 7.4.5 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම

-------------------------------------------------------------

2012 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් කිසිවක් පවත්වා නොතිබුණි.

### 7.5 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**------------------------------------------------------**

| | | **සේවක වර්ගය** | **අනුමත සේවක සංඛ්‍යාව** | **තථ්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු සේවක සංඛ්‍යාව** | **අතිරික්ත සංඛ්‍යාව** |
|---|---|---|---|---|---|---|
| 2012 | | | | | | |
| දෙසැ | (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 12 | 11 | 01 | - |
| ම්බර් | (ආ) | තෘතියික මට්ටම | 06 | 03 | 03 | - |
| 31 | (ඇ) | ද්විතියික මට්ටම | 51 | 34 | 17 | - |
| දිනට | (ඈ) | ප්‍රාථමික මට්ටම | 24 | 17 | 07 | - |
| වූ | (ඉ) | වෙනත් (අනියම්) | - | 02 | - | 02 |
| සේව | | **එකතුව** | **93** | **67** | **28** | **02** |
| ක | | | | | | |

සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

== == == ==

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 28 ක් පිරවීමට සහ බඳවාගෙන තිබූ අතිරික්ත සේවක සංඛ්‍යාව පිළිබඳව විධිමත් අනුමැතියක් ලබා ගැනීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි.

**8. ශීර්ෂය 08 - ජාතික පොලිස් කොමිෂන් සභාව**

---------------------------------------------------

**8.1 විගණන විෂය පථය**

---------------------

ජාතික පොලිස් කොමිෂන් සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 අප්‍රේල් 30 දින කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයාගැනීම් විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම

සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකිවන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 8.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධි විධානයන්, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසි වලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 8.3 විගණන නිරීක්ෂණය

2012 දෙසැම්බර් 31 දිනට මුල්‍ය වාර්තා හා පොත් අනුව ජාතික පොලිස් කොමිෂන් සභාවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) හි දැක්වෙන පොදු නිරීක්ෂණය සහ පහත 8.4 සිට 8.8 දක්වා ඡේද වල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) අයවැය විචලනය

වැය විෂයයන් 11 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 ත් සියයට 100 අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

## 8.4 යහපාලනය හා ගිණුම් කටයුතු භාවය

### 8.4.1. සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් ආයතන ප්‍රධානීන්, අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක

පීඑෆ්/ආර්/2/2/3/5 (4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් කොමිෂන් සභාව විසින් වර්ෂය ආරම්භයේ දී පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම පිළියෙල කර තිබුණේ 2013 පෙබරවාරි 12 දින දීය.

**8.4.2 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

**----------------------------**

ඉහත 8.4.1 හි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව පිළියෙල කරන ලද සංයුක්ත සැලැස්මට අනුකූලව 2010 සහ ඉන් ඉදිරියට කොමිෂන් සභාව විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙළ කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරී සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**8.4.3 වාර්ෂික කාර්ය සාධන වාර්තාව**

**--------------------------------**

ඉහත 8.4.1 හි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනාරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 සහ 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර කොමිෂන් සභාව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව 2013 ජූලි 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**8.5 වත්කම් කළමනාකරණය**

**--------------------------**

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

**--------------------------------------**

2012 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තා වලින් පෙන්වා දී තිබුණු ඌනතා හා ප්‍රයෝජනයට ගත නොහැකි භාණ්ඩ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 757 (2), 770(2) හා 771(3) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

**8.6 කාර්ය සාධනය**

-----------------

ජාතික පොලිස් කොමිෂන් සභාවේ කාර්යාල 12 ක් වෙත සමාලෝචිත වර්ෂයේදී පහත පරිදි පැමිණිළි 601 ක් ලැබී තිබුණි.

| | පැමිණිල්ලේ ස්වභාවය | සංඛ්‍යාව |
|---|---|---|
| (අ) | පොලීසිය විසින් ක්‍රියානොකිරිම (උදාසීනත්වය) | 181 |
| (ආ) | පහරදීම් | 16 |
| (ඇ) | වධහිංසා පැමිණවීම් | 12 |
| (ඈ) | අනිසිලෙස යෙදවීම | 143 |
| (ඉ) | පක්ෂග්‍රාහී වීම | 106 |
| (ඊ) | නීති විරෝධී ලෙස රදවා ගැනීම | 48 |
| (උ) | බොරු චෝදනා කිරීම / රිමාන්ඩ් භාරයට ගැනීම | 32 |
| (ඌ) | අල්ලස් හා දූෂණ | 11 |
| (එ) | කාන්තාවන්ට හා ළමුන්ට හිංසා කිරීම | 02 |
| (ඒ) | පොලිස් අත්අඩංගුවේ මියයාම | 02 |
| (ඔ) | වෙනත් ( පොලිස් නිලධාරින්ගේ පැමිණිළි ඇතුළුව ) | 48 |
| | එකතුව | 601 |

සමාලෝචිත වර්ෂයේදී එම පැමිණිළි වලින් 430 ක් හෙවත් සියයට 71 ක් විසදා තිබුණි. මෙහිදී විසදූ පැමිණිලි යන්න විමර්ශන ලිපිගොනු වසා දැමීම අදහස් වේ. එවැනි අවස්ථා නම්,

(අ) පැමිණිලිකරුවන් විසින් පැමිණිල්ල ඉල්ලා අස්කර ගැනීම.

(ආ) පැමිණිලිකරු විමර්ශනයට සහභාගිවීම සදහා දිගින් දිගටම නොපැමිණිම.

(ඇ) විමර්ශනයේ දී අධිකරණමය ක්‍රියාමාර්ගයක් ගෙන තිබෙන බව අනාවරණය වීම.

(ඈ) විමර්ශනයේ දී පොලිසිය යථා පරිදි ක්‍රියාකර ඇති බව අනාවරණය වීම.

(ඉ) ජාතික පොලිස් කොමිෂන් සභාව මගින් වාර්තා කැදවූ විට පොලිස් නිලධාරින් වැරදි ලෙස ක්‍රියාකර ඇති බව අනාවරණය විම නිසා පොලිසීය මගින්ම විනය කටයුතු ඇරඹීම.

(ඊ) පොලිස් ක්‍රියාමාර්ග ප්‍රමාද වී ඇති විට ජාතික පොලිස් කොමිෂන් සභා විමර්ශනය නිසා විමර්ශන කටයුතු කඩිනම්කර පොලීසිය මගින්ම අවශ්‍ය පියවර ගැනීම.

(උ) පාර්ශවකරුවන් පොලිසියේ දී සමථයකට පත්වී ඇති බව විමර්ශනයේ දී අනාවරණය වීම.

(ඌ) විමර්ශනයේ දි පැමිණිල්ල ජාතික පොලිස් කොමිෂන් සභාවේ විෂය පථයට අයත් නොවන බව පෙනීයාම.

(එ) විමර්ශනයේ දී පැමිණිල්ල සනාථ කිරීම සඳහා සාක්ෂි ඉදිරිපත් නොවීම.

(ඒ) පැමිණිලිකරුවන් එකවර පැමිණිල්ල පොලිස්පති ඇතුළු වෙනත් බලධාරීන් වෙත ඉදිරිපත් කර ඇති අවස්ථා වලදී එකී බලධරයන් කටයුතු කර ඇති බව ජාතික පොලිස් කොමිෂන් සභාවේ විමර්ශනයේ දී අනාවරණය වීම.

## 8.7 අනාර්ථික ගනුදෙනු

--------------------

ජාතික පොලිස් කොමිෂන් සභාව පවත්වාගෙන යනු ලබන ගොඩනැගිල්ලේ මුළු වර්ග ප්‍රමාණය වර්ග අඩි 9750 ක් වන අතර, ඒ සඳහා වර්ග අඩියකට රු.90 ක මුදලක් ගෙවනු ලැබේ. 2012 දෙසැම්බර් 19 දින පැවති 41 වන ජාතික පොලිස් කොමිෂන් සභාවේ මාණ්ඩලික තීරණ අනුව මෙම කාර්යාලය සඳහා වර්ග අඩි 3000-4000 අතර ප්‍රමාණයක කාර්යාල ගොඩනැගිල්ලක් ප්‍රමාණවත් බව තීරණය කර තිබුණි. ඒ අනුව දළ වශයෙන් වර්ග අඩියක් සඳහා රු.90 බැගින් වැඩිපුර වර්ග අඩි 5750 ක පමණ භූමි ප්‍රමාණයක් සඳහා රු.517,500 ක මුදලක් මාසිකව නිෂ්කාර්ය ලෙස වැයකර තිබුණි.

## 8.8 මානව සම්පත් කළමනාකරණය

--------------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**----------------------------------------------------**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 15 | 15 | - |
| (ආ) | තෘතීයික මට්ටම | 03 | - | 03 |
| (ඇ) | ද්විතීයික මට්ටම | 33 | 26 | 07 |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | ප්‍රාථමික මට්ටම | 13 | 12 | 01 |
| | | ---- | ---- | ---- |
| | එකතුව | 64 | 53 | 11 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 11 ක් පිරවීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි.

(ii) තථ්‍ය සේවක සංඛ්‍යාව තුල අනියම් හා කොන්ත්‍රාත් පදනම මත සිටින ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරින් 13 ක් ද ද්විතීය මට්ටමේ එක් නිලධාරියෙක් ද ප්‍රාථමික මට්ටමේ නිලධාරින් දෙදෙනෙක් ද ඇතුළත් වී තිබුණි.

## 9. ශීර්ෂය 09 - පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය

### 9.1 විගණන විෂය පථය

පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ඔක්තෝබර් 28 දින විනිශ්චය අධිකාරයේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 9.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන්

ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 9.3 විගණන නිරීක්ෂණය

---------------------

2012 දෙසැම්බර් 31 දිනට මුල්‍ය වාර්තා හා පොත් අනුව පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි 9.4 සිට 9.7 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

## 9.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

--------------------------------------

### 9.4.1 සංයුක්ත සැලැස්ම

-------------------

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරය විසින් වර්ෂය ආරම්භයේ දී පිළියෙළ කළ යුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි. අවිනිශ්චිත සංඛ්‍යා ලේඛණ මත සංයුක්ත සැලැස්මක් සැකසීම අපහසු බව අධිකාරියේ ලේකම්වරයා විසින් 2014 ජනවාරි 07 දින මා වෙත වාර්තා කර තිබුණි.

### 9.4.2. වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම

------------------------------

ඉහත 9.4.1 ඡේදයේ සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව පිලියෙළ කරන ලද සංයුක්ත සැලැස්මට අනුකූලව 2010 සහ ඉන් ඉදිරියට අධිකාරිය වාර්ෂික ක්‍රියාකාරි සැලැස්මක් පිළියෙළ කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ක්‍රියාකාරි සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 9.4.3. වාර්ෂික කාර්ය සාධන වාර්තා

-------------------------------

ඉහත 9.4.1 ඡේදයේ සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර අධිකාරය විසින් පිළියෙල කළයුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව මුදල් වර්ෂය

අවසන් වී දින 150 ක් ඇතුළත  විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව 2013 ඔක්තෝබර් 14 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 9.4.4. ප්‍රතිපාදන උපයෝජනය

-------------------------

ප්‍රාග්ධන වියදම් සඳහා සළසා තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් වර්ෂය තුළ උපයෝජනය සියයට 35 ක් පමණක් විය.

### 9.5 අනුකූල නොවීම්

------------------

**නීති,රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

----------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| (අ) ව්‍යවස්ථාපිත විධිවිධාන | |
| 2002 අංක 4 දරන පරිපාලන අභියාචනා විනිශ්චය අධිකාරය පනත 7 වන වගන්තිය | විනිශ්චය අධිකාරය වෙත ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක් එය ලැබුණු දින සිට මාස දෙකක කාලසීමාවක් ඇතුළත විභාග කොට අවසාන වශයෙන් සුදුස්සක් කළ යුතු බව දක්වා තිබුණද, ඒ අනුව කටයුතු කර නොතිබුණි. අභියාචනා සඳහා නිරීක්ෂණ වාර්තා කැඳවීමේදී වග උත්තර කරුවන්ගෙන්, රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් කෙරෙන ඉල්ලීම් හා අභියාචකගේ නීතිඥ හෝ රැකවරණ නිලධාරීයාගේ ඉල්ලීම පරිදි දින ලබා දීමට සිදු වීමත් නිසා පනතේ සඳහන් කාලසීමාව තුළ අභියාචනා |

| | |
|---|---|
| | සම්බන්ධයෙන් සුදුස්සක් හෝ නියෝගයක් ලබා දීමට ප්‍රමාද වන බව අධිකාරියේ ලේකම්වරයා විසින් 2014 ජනවාරි 07 දින මා වෙත දන්වා එවා තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදය 10.4 වගන්තිය | මෙම විධිවිධාන අනුව සේවා කාලය වසර 10 ට අඩු නිලධාරින් සඳහා වසර 10 ට නොඅඩු සේවා කාලයක ස්ථිර නිලධාරියකු ඇපකරුවකු ලෙස ඉදිරිපත් කළ යුතු වුවත්, එම අවශ්‍යතාවය සම්පූර්ණ කර නොතිබියදීත් ආපදා ණය ලබා දී තිබුණි. |

## 9.6 කාර්ය සාධනය

----------------

2010 වර්ෂයේ සිට ආයතනයට ලද අභියාචනා හා අවසන් කරන ලද අභියාචනාවල සාරාංශයක් පහත දැක්වේ.

| වර්ෂය | ආරම්භක ශේෂය | වර්ෂය තුළ ලැබුනු ගණන | වර්ෂය තුළ අවසන් කළ ගණන | නිමවී නොමැති අභියාචනා ගණන | නිම කරන ලද අභියාචනාවල ප්‍රතිශතය |
|---|---|---|---|---|---|
| 2010 | 254 | 11 | 200 | 65 | 75 |
| 2011 | 65 | 56 | 45 | 76 | 35 |
| 2012 | 76 | 256 | 141 | 191 | 42 |

2010 වර්ෂයේ අභියාචනා විනිශ්චය කිරීමේ ප්‍රතිශතය සියයට 75 ක් වුවත්, 2011 හා 2012 වර්ෂවලදී එය පිළිවෙලින් සියයට 35 ක් හා සියයට 42 ක් වී තිබුණි.

## 9.7 මානව සම්පත් කළමනාකරණය

---------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 02 | 02 | - |
| (ආ) | ද්විතීයික මට්ටම | 12 | 09 | 03 |
| (ඇ) | ප්‍රාථමික මට්ටම | 04 | 04 | - |
| | එකතුව | 18 | 15 | 03 |

සමාලෝචිත වර්ෂය අවසානය වන විට පුරප්පාඩු 3 ක් සම්පූර්ණ කළ යුතුව තිබුණි.

## 10. ශීර්ෂය 10 - අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව

### 10.1 විගණන විෂය පථය

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 ජනවාරි 6 දින කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ

ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**10.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**10.3 විගණන නිරීක්ෂණය**

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සහ (ආ) හි සඳහන් පොදු නිරීක්ෂණ සහ පහත 10.4 සිට 10.7 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම**

ඉදිරිපත් කරන ලද සැසඳුම් ප්‍රකාශනය අනුව 2012 දෙසැම්බර් 31 දිනට සේවයෙන් ඉල්ලා අස්වීම මත හිඟහිට තිබූ ණය ශේෂවල එකතුව රු.180,887 ක් විය.

**(ආ) අල්ලස් වැටලීම්වල අල්ලස් වශයෙන් පරිහරණය කිරීම සඳහා අත්තිකාරම් ගිණුම**

ඉදිරිපත් කරන ලද සැසඳුම් ප්‍රකාශනය අනුව 2012 දෙසැම්බර් 31 දිනට නිරවුල් නොකරන ලද අත්තිකාරම් ශේෂවල එකතුව රු.14,735,702 ක් වූ අතර ඒ පිළිබඳ කාල විශ්ලේෂණයක් පහත දැක්වේ.

| කාලය (වසර) | නඩු සංඛ්‍යාව | වටිනාකම රු. |
| --- | --- | --- |
| 1 ට අඩු | 76 | 6,601,980 |
| 2 ත් 5ත් අතර | 156 | 4,787,425 |
| 5 ත් 10 ත් අතර | 62 | 2,953,700 |
| 10 ත් 20 ත් අතර | 43 | 389,720 |
| 20 ත් 30 ත් අතර | 08 | 2,625 |
| 30 ට වැඩි | 03 | 252 |
| | 348 | 14,735,702 |

## 10.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 10.4.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත්පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් කොමිෂන් සභාව විසින් පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි. මෙම කොමිෂන් සභාවේ කාර්ය භාරය අනුව සංයුක්ත සැලැස්මක් සකස් කිරීම අපහසු කාර්යයක් බවත්, එබැවින් මෙම අවශ්‍යතාවයෙන් කොමිෂන් සභාව නිදහස් කරන ලෙස මුදල් අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් කර ඇති බවත්, කොමිෂන් සභාවේ ලේකම්වරයා විසින් 2014 ජනවාරි 24 දින මා වෙත දන්වා එවා තිබුණි.

### 10.4.2 වාර්ෂික කාර්ය සාධන වාර්තා

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර කොමිෂන් සභාව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව 2013 නොවැම්බර් 15 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**10.4.3 අභ්‍යන්තර විගණනය**

**-----------------------**

කොමිෂන් සභාව විසින් අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි.

**10.4.4 විගණන හා කළමණාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

**--------------------------------------------------------**

සභාව විසින් විගණන හා කළමණාකරණ කමිටුවක් පිහිටුවා නොතිබුණි.

**10.5 වත්කම් කළමනාකරණය**

**---------------------------**

කොමිෂන් සභාව සතු වාහනයක් උතුරු පුනරුත්ථාපන, ප්‍රතිසංස්කරණ හා සංවර්ධනය පිළිබද අමාත්‍යාංශයට ලබා දී තිබූ නමුත් එය ආපසු ලබාගැනීමට හෝ එම අමාත්‍යාංශය වෙත පවරාදීමට 2013 නොවැම්බර් 15 දින වන විටත් කිසිදු පියවරක් ගෙන නොතිබුණි.

**10.6 කාර්ය සාධනය**

**----------------**

පහත සදහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේදී දූෂණයට එරෙහිව සහනයක් ලබා දීම සඳහා රු.1,000,000 ක ප්‍රතිපාදන සළසා තිබූ නමුදු ඒ වෙනුවෙන් කිසිදු වැඩසටහනක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) 2010 වර්ෂයේදි නඩු භාණ්ඩ පිළිබද විස්තර පරිගණකගත කිරීමේ ක්‍රමයක් පිළිබදව යෝජනාවී තිබුණද එය 2013 නොවැම්බර් 15 වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි.

**10.7 මානව සම්පත් කළමනාකරණය**

**----------------------------------**

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

**------------------------------------------------------**

2012 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබද තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සේවක සංඛ්‍යාව |
|---|---|---|---|

| | | | | |
|---|---|---|---|---|
| (අ) | ජ්‍යෝෂ්ඨ මට්ටම | 34 | 21 | 13 |
| (ආ) | තෘතියික මට්ටම | 05 | 01 | 04 |
| (ඇ) | ද්විතියක මට්ටම | 63 | 51 | 12 |
| (ඉ) | ප්‍රාථමික මට්ටම | 64 | 51 | 13 |
| | | 166 | 124 | 42 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 42 ක් පිරවීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි.

## 11. ශීර්ෂය 11 - මුදල් කොමිෂන් සභාව

### 11.1 විගණන විෂය පථය

මුදල් කොමිෂන් සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 නොවැම්බර් 27 දින කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 11.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

**11.3 විගණන නිරීක්ෂණ**

**--------------------**

2012 දෙසැම්බර් 31 දිනට මුල්‍ය වාර්තා හා පොත් අනුව මුදල් කොමිෂන් සභාවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සහ (ආ) හි දක්වා ඇති පොදු නිරීක්ෂණ සහ පහත 11.4 සිට 11.7 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

**------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 04 ක් සඳහා සළසා තිබුණු එකතුව රු.25,603,000 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 06 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය රු.5,431,785 ක් වූ අතර එය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 35 ක සිට සියයට 98 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(iii) වැටුප් හා වේතන වැය විෂය සඳහා රු.1,306,935 ක පරිපූරක ඇස්තමේන්තු වෙන් කිරීම් මඟින් ප්‍රතිපාදන ලබාගෙන තිබුණද එය මුළුමනින්ම ඉතිරිවී තිබුණි.

**(ආ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**------------------------------------------------------------**

විෂය අංක 01101 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.181,511 ක් වූ අතර එම හිඟ හිටි ශේෂ අයකර ගැනීමට කොමිෂන් සභාව අපොහොසත් වී තිබුණි.

**11.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**------------------------------------**

**11.4.1 සංයුක්ත සැලැස්ම**

**----------------**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පලාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5 (4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් කොමිෂන් සභාව විසින් වර්ෂය ආරම්භයේ දී පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම 2014 පෙබරවාරි 17 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**11.4.2 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

---------------------------------

ඉහත 11.4.1 ජේදයෙහි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දරන අංක 402 සහ 2004 පෙබරවාරි 20 දින දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 402(1) ප්‍රකාර කොමිෂන් සභාව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව 2014 පෙබරවාරි 17 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**11.4.3 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

-----------------------------

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**11.4.4 අභ්‍යන්තර විගණනය**

------------------------

කොමිෂන් සභාව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

**11.4.5 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

---------------------------------------------------------

විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කර නොතිබුණි.

**11.5 වත්කම් කළමනාකරණය**

------------------------------

**නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

---------------------------------------------

කොමිෂන් සභාව විසින් 2012 වර්ෂයට සිදු කරන ලද භාණ්ඩ සමීක්ෂණය අනුව වත්කම් ඒකක 385 ක් නිශ්ක්‍රීයව පැවතුණි.

## 11.6 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්

2008 දෙසැම්බර් 31 දිනැති අංක 30/2008 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට පටහැනිව නිලධාරින් 3 දෙනෙකුට රු.960,179 ක ආපදා ණය ලබාදී තිබුණි.

## 11.7 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 15 | 06 | 09 |
| (ආ) | තෘතියික මට්ටම | 03 | 02 | 01 |
| (ඇ) | ද්විතීක මට්ටම | 46 | 30 | 16 |
| (ඉ) | ප්‍රාථමික මට්ටම | 13 | 06 | 07 |
| | එකතුව | 77 | 44 | 33 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 33 ක් පිරවීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි.

## 12. ශීර්ෂය 12 - ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව

## 12.1 විගණන විෂය පථය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 මැයි 07 දින කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්,

විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 12.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකිම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරිම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 12.3 විගණන නිරීක්ෂණය

---

2012 දෙසැම්බර් 31 දිනට මුල්‍ය වාර්තා හා පොත් අනුව ජාතික අධ්‍යාපන කොමිෂන් සභාවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 12.4 සිට 12.8 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සෙයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

---

කොමිෂන් සභාව විසින් පහත දැක්වෙන ලේඛන පවත්වා නොතිබුණු අතර ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| ලේඛන වර්ගය | අදාළ රෙගුලාසි |
|---|---|
| ස්ථාවර වත්කම් ලේඛනය | 1978 නොවැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

| | |
|---|---|
| පරිගණක උපාංග හා මෘදුකාංග ලේඛනය | 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය |

**(ආ) අයවැය විචලනය**

**-------------------**

(i) එක් වැය ශීර්ෂයක් සඳහා සලසා තිබුණු රු.50,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරිවී තිබුණි .

(ii) වැය විෂයයන් 08 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් රු.14,115,000 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.3,953,852 ක් හෙවත් සියයට 28 ක් ඉතිරි වී තිබුණි. වැය විෂයයන් අතර එම පරාසය සියයට 27 ත් සියයට 82 ත් අතර ප්‍රතිශතයක් ගෙන තිබුණි.

**(ඇ) අයවැය සහය සේවා හදිසි අවශ්‍යතා වගකීම් යටතේ ලබාගත් ප්‍රතිපාදන**

**------------------------------------------------------------------------**

පුනරාවර්තන වැය විෂය 09 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 5 ට වැඩි රු.4,003,852 ක් වූ වියදම් නොවූ ප්‍රතිපාදනයක් තිබියදී 2011 වර්ෂයේ අධ්‍යයන වාර්තාවක භාෂා පරිවර්තන කටයුතු සඳහා රු.281,000 ක පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදනයක් ලබාගෙන තිබුණි.

**12.4 යහපාලනය සහ ගිණුම්කටයුතුභාවය**

**-------------------------------------**

**12.4.1 වාර්ෂික කාර්යසාධන වාර්තා**

**-------------------------------**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක PF/R/2/2/3/5/(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 හා 2004 පෙබරවාරි 20 දින දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ 402 හා 402(1) ප්‍රකාර කොමිෂන් සභාව විසින් පිළියෙල කළයුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක්

ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාළ කාර්ය සාධන වාර්තාව 2013 ජූනි 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 12.5 කාර්යසාධනය

---------------

ක්‍රියාකාරී සැලැස්මෙහි ඇතුළත් කාර්යයන් කිසිවක් ඉටුකර ගැනීමට කොමිෂන් සභාවට නොහැකි වී තිබුණ අතර දැනුමැති සමාජයක් සඳහා අධ්‍යාපන ව්‍යාපෘතියෙන් අනුමත කර තිබූ රු.7,306,940 ක් වූ ආධාර මුදල් නොලැබීමත්, කොමිෂන් සභාව පත් කිරීමට ප්‍රමාද වීමත් ඊට හේතු වී තිබුණි.

## 12.6 කළමණාකරණ දුර්වලතා

--------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

(අ) පුස්තකාල පොත් තොග සම්බන්ධ සමීක්ෂණයක් ආයතනය ආරම්භයේ සිටම සිදුකර නොතිබුණි.

(ආ) රු.938,600 ක වියදමකින් ස්ථාපිත කරන ලද දත්ත බැංකුවේ කටයුතු සඳහා සුදුසු නිලධාරීන් අනුයුක්ත කර නොතිබුණි.

(ඇ) කොමිෂන් සභාව විසින් මුද්‍රණය කරනු ලබන පොත් සම්බන්ධයෙන් පිරිවැය ගණනය කිරීම හා තොග පාලන පටිපාටීන් අනුගමනය කර නොතිබූ අතර අවශ්‍යතාවය නොසලකා මුද්‍රණය කිරීම හේතුවෙන් 2003-2009 අතර කාලය තුළ මුද්‍රිත පොත් 4,382 ක් කොමිෂන් සභාවෙන් ශේෂ වී තිබුණි.

## 12.7 මානව සම්පත් කළමනාකරණය

-----------------------------------

### (අ) අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව

--------------------------------------------------

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ---------------- | | ------------- | ---------- |

| | | | | |
|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 03 | 02 | 01 |
| (ආ) | තෘතියික මට්ටම | 12 | 07 | 05 |
| (ඇ) | ද්විතීක මට්ටම | 10 | 05 | 05 |
| (ඉ) | ප්‍රාථමික මට්ටම | 12 | 12 | - |
| | එකතුව | 37 | 26 | 11 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 11 ක් පිරවීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි.

**(ආ) අවිධිමත් ලෙස වෙනත් පාර්ශවයන්ට නිදහස් කළ මානව සම්පත්**

කොමිෂන් සභාවේ ආරක්ෂක නිලධාරියෙකු 2005 සැප්තැම්බර් සිට 2012 දෙසැම්බර් දක්වාම විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයටත්, අනතුරුව ක්‍රීඩා අමාත්‍යාංශයටත් මුදා හැර එම කාලය තුළ වැටුප් හා දීමනා ලෙස රු.1,833,705 ක් ගෙවා තිබූ අතර එම මුදා හැරීම හේතුවෙන් පෞද්ගලික ආරක්ෂක සේවා ආයතනයකින් සේවා ලබා ගැනීමට සිදුවීම නිසා සමාලෝචිත වර්ෂයේ දී පමණක් රු.547,500 ක් ගෙවීමට සිදු වී තිබුණි.

**12.8 අභ්‍යන්තර පාලනය**

**(අ) අභ්‍යන්තර විගණනය**

ආරම්භයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම කොමිෂන් සභාව විසින් අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කර නොතිබුණි.

**(ආ) කළමනාකරණ හා විගණන කමිටුව ක්‍රියාත්මක කිරීම**

2009 සැප්තැම්බර් 30 දින සිට 2012 දෙසැම්බර් 31 දින දක්වාම විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මකවී නොතිබුණි.

**13. ශීර්ෂය 13 - ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

**13.1 විගණන විෂය පථය**

මානව හිමිකම් කොමිෂන් සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ

විගණන වාර්තාව 2012 ඔක්තොබර් 30 දින මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 13.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැළසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 13.3 විගණන නිරීක්ෂණය

2012 දෙසැම්බර් 31 දිනට මුල්‍ය වාර්තා හා පොත් අනුව මානව හිමිකම් කොමිෂන් සභාවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ පහත 13.4 සිට 13.9 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

## 13.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

### 13.4.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පිඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් සභාව විසින්

වර්ෂය ආරම්භයේදී පිළියෙල කළයුතු වුවත් එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**13.4.2 වාර්ෂික කාර්ය සාධන වාර්තා**

ඉහත 13.4.1 ඡේදයෙහි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය අනුව 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402 (1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර කොමිෂන් සභාව විසින් පිළියෙල කළයුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව 2013 සැප්තැම්බර් 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**13.5 අනුකූල නොවීම්**

**නීති,රීති,රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහකර පහත දැක්වේ.

| නීති,රීති,රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 104(1) | කොමිෂන් සභාවේ වාහනවලට සිදු වූ අනතුරු 02 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර පරීක්ෂණයන් පවත්වා නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 110 | හානි හා පාඩු ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ආ) භාණ්ඩාගාර චක්‍රලේඛ | |

| | |
|---|---|
| 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන චක්‍රලේඛය | එක් එක් ස්ථාවර වත්කම් විෂයට අදාලව එහි පිරිවැය හැඳින්වීම, අත්පත් කර ගත් දිනය, පිහිටීම ආදී සම්පූර්ණ විස්තර සහිතව ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |

(ඇ) ජාතික පුස්තකාල හා ප්‍රලේඛන සේවා මණ්ඩලයේ උපදේශක චක්‍රලේඛ

-----------------------------

| | |
|---|---|
| 2004 ජනවාරි 26 දිනැති හා අංක 2004/පුස/1 දරන චක්‍රලේඛය | සභාවේ පුස්තකාලයේ අස්ථානගත වී තිබූ පොත් 74 ක් සම්බන්ධයෙන් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |

**13.6 කාර්ය සාධනය**

---------------

සමාලෝචිත වර්ෂයේදී විමර්ශනයට භාජනය විය යුතු මුළු පැමිණිලි සංඛ්‍යාව 6,372 ක් වූ අතර වර්ෂය අවසාන වන විට විමර්ශනය කර තිබූ පැමිණිලි සංඛ්‍යාව 2,462 ක් වූයෙන් වර්ෂය අවසාන වන විට තවදුරටත් විමර්ශනය අවසන් නොවූ පැමිණිලි සංඛ්‍යාව 3,910 ක් විය.

**13.7 අධිකාර බලය නොමැති වූ ගනුදෙනු**

------------------------------------

2009 නොවැම්බර් 24 දිනැති අංක DMS/A/08/03/I/TEM දරන කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව කොන්ත්‍රාත් හා අනියම් වැටුප් ලබන සේවකයන්ට**,** වැටුපට අමතරව ගෙවනු ලබන සියයට 25 දීමනාවට හිමිකම් නොමැති වුවද එම උපදෙස්වලට පටහැනිව 2012 වර්ෂයේදී කොන්ත්‍රාත් හා අනියම් සේවකයන් 08 දෙනෙකුට සියයට **25** දීමනාව ලෙස රු.303,198 ක මුදලක් ගෙවා තිබුණි.

**13.8 කලමනාකරණ දූර්වලතා**

පරීක්ෂා කරන ලද පෞද්ගලික ලිපිගොනුවල ඇතුළත් කිසිදු අධ්‍යාපන සහතිකයක් අදාල ආයතන මගින් සනාථ කරවාගෙන නොතිබුණි.

**13.9 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

(අ) 2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක විස්තර | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) ජ්‍යෙෂ්ඨ මට්ටම | 35 | 20 | 15 | - |
| (ආ) තෘතියික මට්ටම | 03 | 01 | 02 | - |
| (ඇ) ද්විතීක මට්ටම | 105 | 105 | - | - |
| (ඈ) ප්‍රාථමික මට්ටම | 52 | 53 | - | 01 |
| (ඉ) වෙනත් (අනියම් / තාවකාලික/ කොන්ත්‍රාත්) | - | 08 | - | 08 |
| එකතුව | 195 | 187 | 17 | 09 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 17 ක් පිරවීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි.

(ආ) 2010 ජුනි 30 දිනැති අංක DMS/E2/01/3/383/1 දරන කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවේ ලිපියට අනුව කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 195 ක් වූ අතර 2013 අගෝස්තු මාසය වන විටත් ආයතනයේ බඳවාගැනීමේ පටිපාටිය අනුමත කරගෙන නොතිබුණි. එසේ තිබියදීත් 2010 දෙසැම්බර් 31 දිනැති අංක 26/2010 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ විධිවිධානවලට පටහැනිව කොන්ත්‍රාත් පදනමින් සිටි සේවකයන් 04 ක් හා අනියම් පදනමින් සිටි සේවකයන් 37 දෙනෙකු 2011 අගෝස්තු 01 දින වසරක පරිවාස කාලයකට යටත්ව ස්ථිර පත්වීම් ලබා දී තිබුණි. සේවයේ ස්ථිර කරනු ලබන නිලධාරීන්ට යම් වැටුප් තලයකට අදාලව මාසික වැටුපක් ගෙවිය යුතු වුවත් මෙම නිලධාරීන් සියළු දෙනාටම ස්ථිර කිරීමට පෙර ගෙවන ලද කොන්ත්‍රාත් හා අනියම් වැටුප දිගින් දිගටම ගෙවා ඇති බව විගණනයේදී අනාවරණය විය.

## 14. ශීර්ෂය 14 - නීතිපති දෙපාර්තමේන්තුව

-----------------------------------------

### 14.1 විගණන විෂය පථය

-----------------------

නීතිපති දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 නොවැම්බර් 25 දින නීතිපතිවරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරික්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරික්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙළ කරන ලද්දකි.

### 14.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

-----------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකිමට ඇතුළත් වේ.

### 14.3 විගණන නිරීක්ෂණය

-----------------------

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව නීතිපති දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සහ (ආ) හි දැක්වෙන පොදු නිරීක්ෂණය සහ පහත 14.4 සිට 14.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

**------------------**

වැය විෂයයන් තුනක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 28 ත් සියයට 50 අතර පරාසයක් ගෙන තිබුණි.

**(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**----------------------------------------------------------------**

විෂය අංක 01401 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.2,181,041 ක් විය,

## 14.4 යහපාලනය හා ගිණුම් කටයුතුභාවය

----------------------------------------

### 14.4.1 වාර්ෂික කාර්යසාධන වාර්තා

**------------------------------**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5/(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්යසාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව 2013 ඔක්තෝබර් මාසය වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 14.4.2 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

--------------------------------

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 14.4.3 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම

---------------------------------------------------------

2012 වර්ෂය සඳහා විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් කිසිවක් පවත්වා නොතිබුණි.

## 14.5 කාර්ය සාධනය

2012 වර්ෂයේ කාර්ය සාධන වාර්තාවට අනුව දෙපාර්තමේන්තුව විවෘත කළ ලිපිගොනු සංඛ්‍යාව හා වැඩ අවසන් කළ ලිපිගොනු සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

| | අංශය | විවෘත කළ ලිපිගොනු සංඛ්‍යාව | වැඩඅවසන් කළ ලිපිගොනු සංඛ්‍යාව | තවදුරටත් කටයුතු කළ යුතු ලිපිගොනු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | අපරාධ | 3249 | 1107 | 2142 |
| (ආ) | සිවිල් | 2714 | 158 | 2556 |
| (ඇ) | ශ්‍රේෂ්ඨාධිකරණ | 765 | 636 | 129 |
| (ඈ) | සංස්ථා | 2123 | 1606 | 517 |
| (ඉ) | මහජන පැමිණිලි | 16765 | 12049 | 4716 |

## 14.6 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත දැක්වේ.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 213 | 165 | 48 | - |
| (ආ) | තෘතියික මට්ටම | 12 | 06 | 06 | - |
| (ඇ) | ද්විතියික මට්ටම | 155 | 106 | 49 | - |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | 213 | 179 | 34 | - |
| (ඉ) | වෙනත්(කොන්ත්‍රාත්) | - | 15 | - | 15 |
| | **එකතුව** | **593** | **471** | **137** | **15** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 137 ක් පිරවීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි.

## 15. ශීර්ෂය 15 -නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව

-----------------------------------------------------

### 15.1 විගණන විෂය පථය

----------------------

නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමණාකරණ විගණන වාර්තාව 2013 ඔක්තෝබර් 28 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 15.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

--------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වාගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

### 15.3 විගණන නිරීක්ෂණය

---------------------

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) යටතේ දක්වා ඇති පොදු නිරීක්ෂණ සහ පහත 15.4 සිට 15.7 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

(i) එක් වැය විෂයයක් යටතේ ප්‍රතිපාදනය කර තිබුණු එකතුව රු.65,066,000 ක් වූ සම්පූර්ණ මූලධන ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

(ii) වැය විෂයයන් 02 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 33 ක සිට සියයට 35 ක් දක්වා වූ පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

## 15.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 15.4.1 සංයුක්ත සැලැස්ම

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් දෙපාර්තමේන්තුව විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත්, එම සැලැස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.
මෙ සම්බන්ධයෙන් 2013 දෙසැම්බර් මාසයේදී නීති කෙටුම්පත් සම්පාදක විසින් පහත සඳහන් අන්දමට මා වෙත වාර්තා කර තිබුණි.

"විවිධ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු, පෞද්ගලික මන්ත්‍රී කෙටුම්පත් හා පළාත් සභා වලින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් මත ඒ ඒ වර්ෂයේදී පනත් පිළියෙල කිරීම සිදු වේ. ඒ අනුව ඉදිරි වර්ෂ තුනක් සඳහා පනත් කෙටුම්පත් කිරීමේ සැලැස්මක් සකස් කිරීම ප්‍රායෝගිකව අපහසු වී ඇත."

### 15.4.2 වාර්ෂික කාර්ය සාධන වාර්තා

ඉහත 15.4.1 ඡේදයෙහි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 හා 2004 පෙබරවාරි 20 දිනැති අංක 402(1) දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ ප්‍රකාර දෙපාර්තමේන්තුව විසින් පිළියෙල කළ යුතු වාර්ෂික කාර්ය සාධන වාර්තාව මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්ය සාධන වාර්තාව 2013 සැප්තැම්බර් වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 15.4.3 අභ්‍යන්තර විගණනය

----------------------

දෙපාර්තමේන්තුව සතුව අභ්‍යන්තර විගණන ඒකකයක් නොතිබූ අතර ජනාධිපති ලේකම් කාර්යාලයේ අභ්‍යන්තර විගණන අංශය මගින් අභ්‍යන්තර විගණන කටයුතු සිදු කර තිබුණි.

### 15.5 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

---------------------------------------

ඇස්තමේන්තුගත පිරිවැය රු.72,500,000 ක් වූ ශ්‍රී ලංකා නීති ප්‍රඥප්ති ප්‍රතිශෝධන කිරීමේ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය අමාත්‍ය මණ්ඩල අනුමැතිය නොලැබීම නිසා ආරම්භ කර නොතිබුණි.

### 15.6 කාර්යසාධනය

----------------

2012 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පහත දැක්වේ.

| රාජකාරියේ ස්වභාවය | 2012 ජනවාරි 01 දිනට කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලීම් සංඛ්‍යාව | 2012 වර්ෂයේදී පාර්ශව වෙතින් ලැබුණු ඉල්ලීම් සංඛ්‍යාව | 2012 දෙසැම්බර් 31 දින වන විට කෙටුම්පත් සකස් කර අදාල පාර්ශව වෙත භාර දුන් සංඛ්‍යාව | 2012 දෙසැම්බර් 31 දිනට කෙටුම්පත් කිරීම අවසන් නොවූ ඉල්ලීම් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| අණ පනත් කෙටුම්පත් කිරිම (මූලික හා සංශෝධන නීති) | 123 | 40 | 37 | 126 |
| පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික පනත් | 79 | 41 | 55 | 65 |
| උපකාරක නීති | 59 | 121 | 69 | 111 |
| පළාත් සභා ප්‍රඥප්ති | 12 | 4 | 5 | 11 |
| එකතුව | 273 | 206 | 166 | 313 |

2012 වර්ෂයේදී පනත් කෙටුම්පත් 92 ක් සකස් කර තිබූ අතර, පනත් 23 ක් පාර්ලිමේන්තුව මගින් සම්මත කර කථානායකවරයා විසින් සහතික කර තිබුණි.

**15.7 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (අ) ජ්‍යෙෂ්ඨ මට්ටම | 37 | 27 | 10 |
| (ආ) තෘතියික මට්ටම | 28 | 04 | 24 |
| (ඇ) ද්විතියක මට්ටම | 62 | 32 | 30 |
| (ඈ) ප්‍රාථමික මට්ටම | 24 | 18 | 06 |
| එකතුව | 151 | 81 | 70 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 70 ක් සම්පූර්ණ කළ යුතුව තිබුණි

**16. ශීර්ෂය 16 - පාර්ලිමේන්තුව**

**16.1 විගණන විෂය පථය**

පාර්ලිමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ජූලි 02 දින පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 16.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

## 16.3 විගණන නිරීක්ෂණය

---

2012 දෙසැම්බර් 31 දිනට මුල්‍ය වාර්තා හා පොත් අනුව පාර්ලිමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඉ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 16.4 සිට 16.11 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනිම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

---

1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව පාර්ලිමේන්තුව විසින් ස්ථාවර වත්කම් ලෙඛණයක් පවත්වා නොතිබුණි.

### (ආ) ලිඛිත විගණන සාක්ෂි ඉදිරිපත් නොකිරීම්

---

2012 සැප්තැම්බර් මාසයේදී පවත්වන ලද පාර්ලිමේන්තු පොදු රාජ්‍ය මණ්ඩලීය සමුළුව සඳහා 2012 වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් රු. මිලියන 100 ක ප්‍රතිපාදන ලබා දි තිබුණි .එයින් සමුළුව සඳහා රු. මිලියන 87.3 ක් පාර්ලිමේන්තු නිල බැංකු ගිණුමට අමතරව ඇති වෙනත් බැංකු ගිණුමකට මාරු කර තිබුණත්, එමඟින් දැරූ වියදම් හෝ ඊට අදාල කිසිදු තොරතුරක් විගණනය සඳහා ඉල්ලා සිටි නමුත් ඉදිරිපත් කර නොතිබුණි.

**(ඇ) ප්‍රතිපාදන ඉතිරිවීම්**

---------------------

වැය විෂයයන් 18 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 9 ත් සියයට 73 ත් අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

**(ඈ) පොදු තැන්පත් ගිණුම**

------------------------

පොදු තැන්පත් ගිණුමට අනුව 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය රු.7,309,701 ක් වුවත් කාල විශ්ලේෂණයට අනුව එම ශේෂය රු.7,273,916 ක් වූයෙන් රු.35,785 ක වෙනසක් නිරීක්ෂණය විය. 2013 අගෝස්තු මාසය වන විට ඉන් රු.25,135 ක ශේෂයක් නිවැරදි කර තිබූ අතර තවදුරටත් රු.10,650 ක වෙනසක් පැවතුණි.

**(ඉ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

---------------------------------------------------------------------

විෂය අංක 01601 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සකස් කළ සැසඳුම් ප්‍රකාශය අනුව එදිනට අයවීම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.3,250,590 ක් විය.

## 16.4 යහපාලනය හා ගිණුම්කටයුතුභාවය

------------------------------------

### 16.4.1 සංයුක්ත සැලැස්ම

-------------------

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් , දෙපාර්තමේන්තු ප්‍රධානින්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානින් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා වූ සංයුක්ත සැලස්මක් පාර්ලිමේන්තුව විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත්, එම සැලස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි. මුදල් හා පරිපාලන කටයුතු පිළිබඳව සංයුක්ත සැලැස්මක් සකස් කරමින් පවතින බව 2013 අගෝස්තු මාසයේදී පාර්ලිමේන්තු මහ ලේකම් වරයා විසින් වාර්තා කර තිබුණි.

**16.5 වත්කම් කළමනාකරණය**

-------------------------

**වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

--------------------------------------

2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2012 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර එම වාර්තා 2013 මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, පාර්ලිමේන්තුව විසින් එම වාර්තා 2013 මැයි 31 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**16.6 අනුකූල නොවීම්**

-----------------

**නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

----------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
| --- | --- | --- |
| | රු. | |
| **(අ) ව්‍යවස්ථාපිත විධිවිධාන** | | |
| 1953 අංක 9 දරන පාර්ලිමේන්තු කාර්ය මණ්ඩල පනත | | |
| (i) 4 වගන්තිය | | පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩලය වෙත 2010 වර්ෂයේදී වැටුප් වර්ධක 3 ක් හා 2012 වර්ෂයේදී අතිරේක වැටුප් වර්ධක 02 ක් ලබා දී තිබුණත්, ඒ සඳහා පනතේ විධිවිධාන ප්‍රකාරව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබාගෙන නොතිබුණි. |

| | |
|---|---|
| (ii) 5 වගන්තිය | වැටුප් ගෙවීම සම්බන්ධ කොන්දේසි ,කුලී දීමනා, වෙනත් දීමනා, වැටුප් වර්ධක ප්‍රදානයන් සහ නිවාඩු , විශ්‍රාමික වයස , විශ්‍රාම වැටුප් ආදිය සම්බන්ධයෙන් පනතේ විධිවිධාන ප්‍රකාරව මුදල් රෙගුලාසි සකස් කර නොතිබුණි. |

**(ආ) ආයතන සංග්‍රහය**

**------------------**

| | |
|---|---|
| 11 **පරිච්ඡේදයේ** 2 **වගන්තිය** | ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාර රාජ්‍ය සේවයේ සෑම තනතුරක් සඳහාම බඳවා ගැනීමේදී තනතුරේ වැටුප් පරිමානය, සුදුසුකම්, වයස් සීමාවන් හා අදාල අනෙකුත් විස්තර නිශ්චිතව ඇතුළත් කර විධිමත් බඳවාගැනීමේ පටිපාටියක් සකස් කර අදාල අනුමැතිය ලබාගත යුතු නමුත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

**(ඇ) මුදල් රෙගුලාසි**

**---------------**

| | |
|---|---|
| මුදල් රෙගුලාසි 1645 (අ) | වාහන භාර නිලධාරීන් විසින් එක් එක් වාහනය වෙනුවෙන් ලොග් සටහන් පොත් නිසි පරිදි අදාල සටහන් යොදා පවත්වා නොතිබුණි. |

**(ඈ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ**

**--------------------------**

| | |
|---|---|
| 2008 දෙසැම්බර් 31 දිනැති 646,340 අංක 30/2008 දරන චක්‍රලේඛයේ 02 ඡේදය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව රු. 250,000 ක් හෝ මාස 10 ක වැටුප යන දෙකින් අඩු මුදල ආපදා ණය වශයෙන් ලබාදිය යුතු නමුත් එම විධිවිධානවලට පටහැනිව එම සීමාවන් ඉක්මවා ණය ප්‍රදානය කර තිබුණි. |

**(v) ගැසට්පත්‍ර**

-----------

| | | |
|---|---|---|
| 2008 ජනවාරි 01 දිනැති අංක 1530/13 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් සංශෝධිත 2006 අංක 12 දරන මුද්දර බදු (විශේෂ විධිවිධාන) පනත | 5,079,710 | රු.25,000 ට වැඩි ගෙවීම් සඳහා රු.25 ක මුද්දර ගාස්තු අය කර නොතිබුණි. |

**16.7 බැංකු ගිණුම් මෙහෙයවීමේ අඩුපාඩු**

**-------------------------------------**

වර්ෂ කීපයක සිට පාර්ලිමේන්තුවේ නිල බැංකු ගිණුම සම්බන්ධයෙන් පිළියෙල කරන බැංකු සැසඳුම් ප්‍රකාශවල ඇතුළත් රු.1,315,440 ක ශේෂයක් නිරවුල් කිරීම සඳහා පියවර ගෙන නොතිබූ අතර මෙම තත්ත්වය පසුගිය වාර්තාවලින්ද පෙන්වා දී තිබුණත්, ඒ පිළිබඳ සුදුසු පියවර ගැනීමට වගකිව යුතු නිලධාරියකුගේ අවධානයට යොමු වී නොතිබුණි.

**16.8 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

------------------------------

පාර්ලිමේන්තුව විසින් කර ඇති සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණ වලදී එසේ අනාවරණය වූ ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) ප්‍රවාහන දුෂ්කරතා සැලකිල්ලට ගෙන පාර්ලිමේන්තු රැස්වීම් දිනයන්හි ප.ව. 6.30 න් පසු සේවයේ යෙදෙන නිලධාරීන්ට දිනකට රු. 750 ක දීමනාවක් ගෙවීමට පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලීය උපදේශක කාරක සභාව තීරණය කර තිබූ අතර නිල වාහන ලබා දී ඇති නිලධාරීන්ටද මෙම දීමනාව ගෙවා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී ශීර්ෂ 16 පාර්ලිමේන්තුව යටතේ ලැබුණු ප්‍රතිපාදන වලින් විදේශ සම්බන්ධතා හා සංධාන කාර්යාලය වැය විෂයය යටතේ ලැබුන රු. මිලියන 30 ක් හා සම්මාදම් හා දායක මුදල් වැය විෂයය යටතේ ලැබුන රු. මිලියන 8.5 ක් වූ ප්‍රතිපාදන වැය කළ ආකාරය දැක්වෙන කිසිදු තොරතුරක් විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. මෙම සම්පූර්ණ ප්‍රතිපාදන පාර්ලිමේන්තු නිල බැංකු ගිණුමට අමතරව ඇති වෙනත් බැංකු ගිණුම් දෙකකට මාරු කර තිබූ අතර එම සියළු වටිනාකම් වර්ෂයේ වියදම් වශයෙන් භාණ්ඩාගාරයට වාර්තා කර තිබුණි.

## 16.9 අවිධිමත් ගනුදෙනු

**ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පරිපාටියෙන් බැහැරවීම්**

ජයන්තිපුර ආපන ශාලා භූමියේ ආරක්ෂිත වැට ඉදිකිරීම,මුළුතැන්ගෙය සඳහා උපකරණ මිලදී ගැනිම, ජයන්තිපුර ආපන ශාලාව අසල කොන්ක්‍රීට් ගල් ඇසිරීම යන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී ලංසුගත ලියවිලිවල නියමයන් හා කොන්දේසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 16.10 අනාර්ථික ගනුදෙනු

2009 වර්ෂයේ සිට පාර්ලිමේන්තුවට අයත් ජයන්තිපුර ආපන ශාලාව කුලියට දීමෙන් මාසිකව රු.42,000 බැගින් අයකර ගෙන තිබූ නමුත් ආපන ශාලාව හා අනෙකුත් කඩ කාමර 2012 අප්‍රේල් මාසයේ සිට රු.30,000 බැගින් කුලී අයකර ගෙන පොලිස් සේවා වනිතා ඒකකයට ලබා දී තිබුණද ඒ සඳහා ලිඛිත ගිවිසුමක් නොතිබුණි. සේවා වනිතා ඒකකය විසින් කඩ කාමර 6 කින් එක් කඩයක් රු.30,000 බැගින් වූ මාසික කුලියකට වෙනත් පාර්ශවයන් වෙත ලබා දී තිබුණු බව විගණන පරීක්ෂාවේදී අනාවරණය විය.

## 16.11 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (අ) ජ්‍යෙෂ්ඨ මට්ටම | 79 | 75 | 04 |
| (ආ) තෘතියික මට්ටම | 127 | 109 | 18 |
| (ඇ) ද්විතියක මට්ටම | 208 | 190 | 18 |
| (ඈ) ප්‍රාථමික මට්ටම | 469 | 445 | 24 |
| (ඉ) වෙනත් (අනියම් / තාවකාලික /කොන්ත්‍රාත්) | 88 | 88 | - |
| එකතුව | 971 | 907 | 64 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පැවති පුරප්පාඩු 64 න් 2013 ජූලි මාසය වන විට පුරප්පාඩු 42 ක් පිරවීමට කටයුතු කර තිබුණි.

## 17. ශීර්ෂය 17 - පාර්ලිමේන්තුවේ සභානායක තුමාගේ කාර්යාලය

### 17.1 විගණන විෂය පථය

පාර්ලිමේන්තුවේ සභානායකතුමාගේ කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 මැයි 30 දින සභානායක කාර්යාලයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනිම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 17.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරිම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුලත් වේ.

### 17.3 විගණන නිරීක්ෂණය

2012 දෙසැම්බර් 31 දිනට මුල්‍ය වාර්තා හා පොත් අනුව සභානායක කාර්යාලයේ විසර්ජන ගිණුම මෙහි පහත 17.4 සිට 17.7 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනිම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**17.4 යහපාලනය හා ගිණුම්කටයුතුභාවය**

**--------------------------------------**

**17.4.1 සංයුක්ත සැලැස්ම**

**--------------------**

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානින්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානින් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලස්මක් කාර්යාලය විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කල යුතු වුවත්, එම සැලස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**17.5 වත්කම් කළමනාකරණය**

**-------------------------**

**බේරුම් නොකළ බැරකම්**

**-------------------------**

කාර්යාලය විසින් 2012 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.47,473 ක් වු අතර ඒවා වසරකට අඩු කාල පර්ච්ඡේදයකට අදාල විය.

**17.6 අනුකූල නොවීම්**

**------------------**

**නීති,රීති,රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

**---------------------------------------------**

2008 ජනවාරි 01 දිනැති අංක 1530/13 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය මගින් සංශෝධිත 2006 අංක 12 දරන මුද්දර බදු (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන ප්‍රකාර රු.25,000 ඉක්මවන ගෙවීම් සඳහා මුද්දර ගාස්තු අයකළ යුතු වුවත්, රු.1,144,016 ක් වූ ගෙවීම් සඳහා මුද්දර බදු අයකර නොතිබුණි.

**17.7. මානව සම්පත් කළමනාකරණය**

**----------------------------------**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

**----------------------------------------------**

2012 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 3 | 3 | - |
| (ආ) | තෘතියික මට්ටම | 3 | 3 | - |
| (ඇ) | ද්විතියක මට්ටම | 11 | 9 | 2 |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | 14 | 12 | 2 |
| | | 31 | 27 | 4 |

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පුරප්පාඩු 04 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

## 18. ශීර්ෂය 18 - පාර්ලිමේන්තුවේ ආණ්ඩුපක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලය

### 18.1 විගණන විෂය පථය

ආණ්ඩුපක්ෂයේ ප්‍රධාන සංවිධායක කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 මැයි 30 දින කාර්යාලයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 18.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම, සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ

ලෙස ඉදිරිපත් කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගකිම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරිම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකිමට ඇතුළත් වේ.

## 18.3 විගණන නිරීක්ෂණය

2012 දෙසැම්බර් 31 දිනට මුල්‍ය වාර්තා හා පොත් අනුව ආණ්ඩුපක්ෂ ප්‍රධාන සංවිධායක කාර්යාලයේ විසර්ජන ගිණුම මෙහි (අ) සහ (ආ) හි වූ පොදු නිරීක්ෂණ සහ පහත 18.4 සිට 18.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනිම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) අයවැය විචලනය

වැය විෂයයන් 06 ක් සඳහා රු.2,259,500 ක ප්‍රතිපාදන සලසා තිබුණු අතර එයින් රු.1,716,608 ක් උපයෝජනය කර තිබූ අතර ඉතිරිය රු.542,892 ක් විය. එක් එක් වැය විෂයය යටතේ ඉතිරි වූ මුදල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 8 සිට සියයට 63 දක්වා පරාසයක විය.

### (ආ) රාජ්‍ය වියදම් කළමනාකරණය

2011 දෙසැම්බර් 30 දිනැති අංක 155 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව 2012 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවලින් සලසා තිබුණු ප්‍රතිපාදනවලින් මූලධන ප්‍රතිපාදනවලින් සියයට 9 ක ප්‍රතිපාදන ඉතිරි කළ යුතු වුවත්, කාර්යාලය විසින් මූලධන ප්‍රතිපාදනවලින් ඉතිරි කර තිබුණේ සියයට 5 ක ප්‍රතිශතයකි.

## 18.4 යහපාලනය හා ගිණුම්කටයුතුභාවය

### 18.4.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානින්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානින් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලස්මක් කාර්යාලය විසින් වර්ෂය

ආරම්භයේදී පිළියෙල කල යුතු වුවත්, එම සැලස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි

**18.4.2 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම**

විගණන හා කළමනාකරණ කමිටුව පිහිටුවා නොතිබුණි.

**18.5 අනුකූල නොවීම්**

මුදල් රෙගුලාසි 231 (1) (11) විධිවිධාන ප්‍රකාරව රු.22,515 ක් වූ ගෙවීම තහවුරු කිරීමට අවශ්‍ය ලියකියවිලි කිසිවක් නොමැතිව ගෙවීම් සිදුකර තිබුණි.

**18.6 මානව සම්පත් කළමනාකරණය**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 2 | 2 | - |
| (ආ) | තෘතියික මට්ටම | 8 | 7 | 1 |
| (ඇ) | ද්විතියක මට්ටම | 15 | 11 | 4 |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | 17 | 17 | - |
| (ඉ) | වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 1 | 1 | - |
| | එකතුව | 43 | 38 | 5 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පුරප්පාඩු 05 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

## 19. ශීර්ෂය 19 - පාර්ලිමේන්තුවේ විපක්ෂනායකතුමාගේ කාර්යාලය

---

### 19.1 විගණන විෂය පථය

---

පාර්ලිමේන්තුවේ විපක්ෂනායකතුමාගේ කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ජුනි 11 දින කාර්යාලයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිර්ක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 19.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 19.3 විගණන නිරීක්ෂණ

---

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව පාර්ලිමේන්තුවේ විපක්ෂ නායකතුමාගේ කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) යටතේ දක්වා ඇති පොදු නිරීක්ෂණය සහ පහත 19.4 සිට 19.7 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) **අයවැය විචලනය**

-------------------

වැය විෂයයන් 05 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12 ත් සියයට 96 ත් අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

## 19.4 යහපාලනය හා ගිණුම්කටයුතුභාවය

----------------------------------------

### 19.4.1 සංයුක්ත සැලැස්ම

--------------------

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානින්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානින් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් කාර්යාලය විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළ යුතු වුවත්, එම සැලස්ම 2012 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

### 19.4.2 අභ්‍යන්තර විගණනය

------------------------

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

### 19.4.3 විගණන හා කළමනාකරණ කමිටුව ක්‍රියාත්මක කිරීම

------------------------------------------------------------

විගණන හා කළමනාකරණ කමිටුවක් ස්ථාපිත කර නොතිබුණි.

## 19.5 වත්කම් කළමනාකරණය

------------------------------

**බේරුම් නොකළ බැරකම්**

------------------------------

කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.723,225 ක් වු අතර, එම ශේෂය වර්ෂයකට අඩු කාල පර්ච්ඡේදයකට අදාල විය.

## 19.6 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|
| **(අ) ආයතන සංග්‍රහය** | | |
| (i) V පරිච්ඡේදයේ 7 වගන්තිය | - | කාර්යාලයේ සම්බන්ධීකරණ ලේකම්වරියක් 2012 සැප්තැම්බර් 04 දින සිට 2012 ඔක්තෝබර් 07 දින දක්වා කාලපරිච්ඡේදය තුළ සේවයට වාර්තා කර නොතිබුණු අතර විධිමත් පරිදි නිවාඩු අනුමත කර ගැනීමද සිදුකර නොතිබුණි. නිලධාරිනිය මෙම කාලය තුළදී අනුමැතියකින් තොරව විදේශ ගත වී තිබුණ බවත් එම කාලයට අදාල සම්පූර්ණ වැටුප් හා දීමනා ලෙස රු. 70,770 ක් ලබාගෙන තිබූ බවත් නිරීක්ෂණය විය. |
| (ii) xxviii පර්ච්ඡේදයේ 1.3 වගන්තිය හා 2009 අප්‍රේල් 16 දිනැති අංක 9/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | - | සෑම නිලධාරියකුම පැමිණෙන හා පිටත්ව යන වේලාව ස්වකීය අත්සනද සහිතව සටහන් කළ යුතු වුවත්, නිලධාරීන් තිදෙනෙකු පමණක් කිසිදු දිනයක කාර්යාලයේ පවත්වාගෙන යන පැමිණීමේ ලේඛණයේ පැමිණීම හා පිටවීම සටහන් කර නොතිබුණි. සෑම අවස්ථාවකදීම නියමිත අයුරින්ම පැමිණීම හා පිටවීම පිළිබඳ රෙගුලාසි අනුගමනය කිරීම අපහසු බවත් රජයේ කාර්යාලයකට වුවද මෙවැනි කරුණු පිළිබඳව යථාවාදීව සළකා බැලිය යුතු බවත් විපක්ෂ නායක කාර්යාලයේ ලේකම් මා වෙත දන්වා එවා තිබුණි. |

(ආ) මුදල් රෙගුලාසි

----------------

| | | |
|---|---|---|
| (i) මුදල් රෙගුලාසි 102 - 110 | 500,000 | වාහන අනතුරකින් සිදු වූ අලාභය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි විධිවිධාන අනුව කටයුතු කර නොතිබූ අතර වාහන අනතුරු පිළිබඳ තොරතුරු ඇතුලත් කිරීමට හානි පිළිබඳ ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 262 (2) | 320,291 | ගෙවීම් වවුචර් වල හා ඒවා තහවුරු කරන ලියවිලිවල ගෙවන ලදී මුද්‍රාව යොදා නොතිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 1646 | - | මෝටර් වාහනවල දෛනික ධාවන සටහන් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. |

(ඇ) රාජ්‍ය මුදල් චක්‍රලේඛ

------------------------

| | | |
|---|---|---|
| 2008 අප්‍රේල් 24 දිනැති අංක 431 දරන චක්‍රලේඛයේ 1 ඡේදය | 1,366,518 | විදේශ සංචාරවලදී ගුවන් ටිකට්පත් මිලදී ගැනිම ශ්‍රී ලංකා ගුවන් සේවා සමාගම හෝ මිහින්ලංකා සමාගමින් කළ යුතු වුවත් එම විධිවිධාන වලට පටහැනිව කටයුතු කර තිබුණි. |

(ඈ) ජාතික අයවැය චක්‍රලේඛ

------------------------

| | | |
|---|---|---|
| 2004 ඔක්තෝබර් 11 දිනැති අංක 118 දරන චක්‍රලේඛයේ 1.1.3- 1.1.7 දක්වා ඡේද | 905,130 | ස්ථාන මාරු ලැබ පැමිණි නිලධාරීන්ගේ ණය ශේෂ අදාල කාලය තුළදී මාසික ගිණුම් සාරාංශ මගින් පියවීමට කටයුතු කර නොතිබුණි. |

## 19.7 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (අ) ජ්‍යෙෂ්ඨ මට්ටම | 3 | 2 | 1 |
| (ආ) තෘතියික මට්ටම | 11 | 6 | 5 |
| (ඇ) ද්විතියක මට්ටම | 21 | 19 | 2 |
| (ඈ) ප්‍රාථමික මට්ටම | 17 | 15 | 2 |
| (ඉ) වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 10 | 10 | - |
| එකතුව | 62 | 52 | 10 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 10 ක් පිරවීමට කටයුතු කර නොතිබුණි.

## 20. ශීර්ෂය 20 - මැතිවරණ දෙපාර්තමේන්තුව

------------------------------------------

### 20.1 විගණන විෂය පථය

------------------------

මැතිවරණ දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 නොවැම්බර් 27 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 20.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

----------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම ප්‍රධාන ගණන් දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරිම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකිමට ඇතුළත් වේ.

### 20.3 විගණන නිරීක්ෂණය

-------------------------

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව මැතිවරණ දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ පහත 20.4 සිට 20.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයාගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**20.4 අනුකූල නොවීම්**

------------------

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

---------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
| --- | --- |
| මුදල් රෙගුලාසි | |
| (අ) මුදල් රෙගුලාසි 103 (1) | හදිසි අනතුරු සම්බන්ධයෙන් නොපමාව පොලිසියට වාර්තා කළ යුතු වුවත් වාහන අනතුරු 03 කට අදාලව පොලිසියට වාර්තා කර පොලිස් වාර්තා ලබා ගෙන නොතිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි 104 (1) (අ) | පාඩුවක් හෝ අලාභයක් සිදුවූ වහාම එහි ප්‍රමාණය හා හේතු නිශ්චිත වශයෙන් දැන ගැනීමටත්, ඊට වගකිව යුතු පාර්ශවයන් නිශ්චය කිරීම සඳහා පරීක්ෂණයක් ආරම්භ කළ යුතු වුවත් වාහන අනතුරු සම්බන්ධයෙන් එම විධිවිධාන අනුව කටයුතු කර නොතිබුණි. |

**20.5 පාඩු හා හානි**

------------------

අවුරුදු 28 ක් පමණ පැරණි රු.202,837 ක් වූ අලාභ හානි 3 ක් සම්බන්ධයෙන් 2013 දෙසැම්බර් 31 වන විටත් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 20.6 මානව සම්පත් කළමනාකරණය

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2012 දෙසැම්බර් 31 දිනට වු සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 40 | 32 | 08 |
| (ආ) | තෘතියික මට්ටම | 04 | 04 | - |
| (ඇ) | ද්විතියක මට්ටම | 381 | 330 | 51 |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | 155 | 149 | 6 |
| (ඉ) | වෙනත් (අනියම්) | 23 | 17 | 6 |
| | එකතුව | 603 | 532 | 71 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පුරප්පාඩු 71 ක් පිරවිය යුතුව තිබුණි.

## 21. ශීර්ෂය 21 - විගණකාධිපති

### 21.1 විගණන විෂය පථය

විගණකාධිපති දෙපාර්තමේන්තුවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදි. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 අප්‍රේල් 28 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කල හැකි වන පරිදි පිළියෙළ කරන ලද්දකි.

**21.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම**

-----------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**21.3 විගණන නිරීක්ෂණය**

----------------------

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 21.4 සහ 21.5 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

(අ) අයවැය විචලනය

--------------------

වැය විෂයයන් 03 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය රු.2,578,513 ක් වූ අතර එය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 83 ක සිට සියයට 92 ක් අතර පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ආ) ආදායම් ගිණුම

------------------

(i) ඉදිරිපත් කළ ගිණුමට අනුව රු.193,085,717 ක් වූ ආදායම් හිඟ හිට තිබුණු අතර එම හිඟ හිටි ආදායම් අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්වයක පැවතුනි.

(ii) 2011 දෙසැම්බර් 31 දිනට පැවැති එකතුව රු.162,699,335 ක් වූ හිඟ ආදායම් ප්‍රමාණය සමඟ 2012 දෙසැම්බර් 31 දිනට පැවැති එකතුව රු.193,085,717 ක් වූ හිඟ ආදායම් ප්‍රමාණය සසඳන විට රු.30,386,382 කින් එනම් සියයට 18.68 කින් වැඩි වී තිබුණි.

(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

---------------------------------------------------------------------------

විෂය අංක 02101 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශ ප්‍රකාර එදිනට අයවීම හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.2,342,900 ක් විය.

## 21.4 අනුකූල නොවීම

--------------------

ඇතැම් ගෙවීම් වවුචර් සම්බන්ධයෙන් අංක 264 (1) දරන මුදල් රෙගුලාසියෙන් සහ 2006 අංක 12 දරන මුද්දර බදු (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන අනුව ක්‍රියා නොකිරීම් නිරීක්ෂණය විය.

## 21.5 මානව සම්පත් කළමනාකරණය

------------------------------------

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

------------------------------------------------------

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (අ) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 355 | 175 | 180 |
| (ආ) | ද්විතීයික මට්ටම | 1214 | 907 | 307 |
| (ඇ) | තෘතියික මට්ටම | 178 | 143 | 35 |
| (ඈ) | ප්‍රාථමික මට්ටම | 181 | 125 | 56 |
| | එකතුව | 1928 | 1350 | 578 |

## 22. ශීර්ෂය 22 - පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්තුමාගේ කාර්යාලය

### 22.1 විගණන විෂය පථය

පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්තුමාගේ කාර්යාලයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු මුල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ජුනි 06 දින කොමසාරිස්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිර්ක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබි ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුලත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 22.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මුල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරිම ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වගකිම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරිම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරිම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකිමට ඇතුලත් වේ.

### 22.3 විගණන නිරීක්ෂණය

2012 දෙසැම්බර් 31 දිනට මුල්‍ය වාර්තා හා පොත් අනුව කාර්යාලයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශනය මෙහි (අ) සිට (ඇ) දක්වා වු පොදු නිරීක්ෂණ සහ පහත 22.4 සිට 22.6 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනිම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ගිණුම් ඉදිරිපත් කිරිම**

----------------------------

කාර්යාලය විසින් 2013 මාර්තු 31 දින වන විට පහත සඳහන් ගිණුම් විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

| ශීර්ෂය / විෂය අංකය | **ගිණුමේ නම** |
|---|---|
| 22 | විසර්ජන ගිණුම |
| 02201 | රජයේ නිලධාරීන්ට අත්තිකාරම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශනය |

**(ආ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

---------------------------------------------------

කාර්යාලය විසින් 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛණයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි.

**(ඇ) රාජ්‍ය වියදම් කළමනාකරණය**

**---------------------------------**

2012 වර්ෂය සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද වාර්ෂික අයවැය ඇස්තමේන්තු මගින් සලසා තිබුණු ප්‍රතිපාදන වලින් 2011 දෙසැම්බර් 30 දිනැති අංක 155 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික අයවැය ඇස්තමේන්තුවේ සලසා තිබුණු පුනරාවර්තන ප්‍රතිපාදනවලින් සියයට 2 ක ප්‍රතිපාදන ඉතිරි කළ යුතු වුවත්, කාර්යාලය විසින් පුනරාවර්තන ප්‍රතිපාදනවලින් සියයට 0.78 ක ප්‍රතිශතයක් පමණක් ඉතිරි කර තිබුණි.

**(ඈ) රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**--------------------------------------------------------------**

(i) විෂය අංක 02201 දරන රජයේ නිලධාරින්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2012 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවිම් හිඟ හිට තිබුණු ශේෂවල එකතුව රු.62,988 ක් විය.

(ii) දෙපාර්තමේන්තු පොත් හා භාණ්ඩාගාර පරිගණක වාර්තා අනුව වර්ෂ 15ක සිට රු.4,921 ක වෙනසක් පැවතුණු අතර සමාලෝචිත වර්ෂයේදීද මෙය නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(iii) කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා පාලන ගිණුමේ ශේෂය අතර රු.36,758 ක වෙනසක් පැවතුණි.

**22.4 යහපාලනය හා ගිණුම්කටයුතුභාවය**

---

**22.4.1 අභ්‍යන්තර විගණනය**

---

අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණි.

**22.4.2 විගණන හා කළමනාකරණ කමිටු ක්‍රියාත්මක කිරීම**

---

විගණන හා කළමනාකරණ කමිටු ස්ථාපිත කර නොතිබුණි.

**22.5 වත්කම් කළමනාකරණය**

---

**(අ) වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

---

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2012 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදු කර එම වාර්තා 2013 මාර්තු 31 දිනට ප්‍රථම විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවත්, කාර්යාලය විසින් එම වාර්තා 2013 මැයි 31 දින වන විටත් විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි. අවසාන වශයෙන් භාණ්ඩ සමීක්ෂණය පවත්වා තිබුණේ 2011 වර්ෂය වෙනුවෙනි.

(ii) 2011 වර්ෂයට අදාල සමීක්ෂණ මණ්ඩල වාර්තාවලින් පෙන්වා දී තිබුණු ඌනතා සම්බන්ධයෙන් හා වෙනත් නිර්දේශ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි හා 2009 නොවැම්බර් 13 දිනැති අංක 438 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ විධිවිධාන පරිදි කටයුතු කර නොතිබුණි.

**(ආ) බේරුම් නොකළ බැරකම්**

**-------------------------**

2012 දෙසැම්බර් 31 දිනට කාර්යාලයේ බේරුම් නොකළ බැරකම් රු.51,614 ක් වූ අතර, ඒවා වසරකට අඩු කාල පරිච්ඡේදයකට අදාල විය.

**22.6 මානව සම්පත් කළමනාකරණය**

**-------------------------------**

**අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**
**-----------------------------------------------**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (අ) ජ්‍යෙෂ්ඨ මට්ටම | 1 | 1 | - |
| (ආ) ද්විතීයික මට්ටම | 2 | 1 | 1 |
| (ඇ) තෘතියික මට්ටම | 18 | 9 | 9 |
| (ඈ) ප්‍රාථමික මට්ටම | 8 | 2 | 6 |
| (ඉ) වෙනත් (අනියම්/ තාවකාලික/ කොන්ත්‍රාත් පදනම) | 1 | 1 | - |
| එකතුව | 30 | 14 | 16 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 16 ක් පිරවීමට කාර්යාලය කටයුතු කර නොතිබුණි.